ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුළු බොහෝ PDF දේ ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..



# ක්‍රියාකාරකම් කාමරය සඳහා
# උපදෙස් සංග්‍රහය







PLAN INTERNATIONAL

අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

**ක්‍රියාකාරකම් පාදක ප්‍රාථමික අධ්‍යාපන සැලසුම් තුළින්**
**නිපුණතා සපිරි දරුවන් ගොඩනගමු.**

ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුට ම ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ මුඛ්‍ය අභිමතාර්ථය සාක්ෂාත් කරලීම සඳහා 2015 වර්ෂයේ සිට අප රජය විසින් විවිධ වූ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරමින් පවතියි. ඒ අතර 2016 වර්ෂයේ දී අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% දක්වා වැඩි කිරීමට ගන්නා ලද තීරණය අප ලැබූ සුවිශේෂ ජයග්‍රහණයකි.

මේ යටතේ පවතින අධ්‍යාපන ක්‍රමය වර්තමාන හා අනාගත අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කිරීමටත් සියලු ම දරුවන්ට පාසල් පද්ධතිය තුළ සමාන අධ්‍යාපන අවස්ථා සැලසීමටත් විශේෂ ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක වෙමින් පවතියි. "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන ඒ අතර ප්‍රමුඛ සහ සුවිශේෂ වැඩසටහනකි.

මවුපිය ඇසුරින් මිදී පාසල වෙත පැමිණෙන දරුවන් යහපත් පුරවැසියන් ලෙස සමාජානුයෝජනය කිරීමේ වගකීම වැඩිහිටියන් ලෙස අප සියල්ලන්ට ම පැවරී ඇත. විශේෂයෙන් ම ප්‍රාථමික අධ්‍යාපනය තුළින් මේ සඳහා විශාල දායකත්වයක් ලැබේ. ඒ අනුව 2016 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම නව ජාතික අධ්‍යාපන වැඩසටහන වන "ළඟම පාසල හොඳම පාසල" යන වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත.

ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් ප්‍රාථමික පාසල්වල හා ප්‍රාථමික අංශ සහිත ද්විතියික පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම ප්‍රමුඛ කාර්යයකි. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිටින සිසුන් ක්‍රියාකාරී අධ්‍යාපනයට වඩාත් නැඹුරු කිරීම සඳහා මෙම ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන තුළ සකස් කරන ක්‍රියාකාරකම් කාමරය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රාථමික අධ්‍යාපන විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අදාළ කරගත හැකි ඉගෙනුම් උපකරණ රැසක් මෙම ක්‍රියාකාරකම් කාමරය තුළින් හඳුන්වාදීම මඟින් දරුවන් ක්‍රියාකාරී අධ්‍යාපන රටාවකට හුරු කරවීමට ද පිටුබලයක් ලැබෙනු නිසැක ය. මවුබස, ගණිතය, ඉංග්‍රීසි හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන විෂයයන් සියල්ලට ම පොදුවේ යොදාගත හැකි ඉගෙනුම් උපකරණ ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරුන් වෙත හඳුන්වා දීමටත්, ඒ හරහා නව ඉගෙනුම් උපකරණ ගොඩනගා ගැනීමට ගුරුවරුන් පෙලඹවීමටත් මෙම උපදෙස් සංග්‍රහය බෙහෙවින් ම උපකාරී වනු ඇති බව මගේ විශ්වාසය යි.

මෙම උපදෙස් සංග්‍රහය සම්පාදනය කිරීමෙහිලා ප්‍රමුඛතාව ගෙන කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාවටත්, ජාතික අධ්‍යාපන ආයතනයටත්, Plan International Sri Lanka ආයතනයටත් ස්තුතිය පිරිනමමි. ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරකම් කාමරය තුළ මෙම ඉගෙනුම් උපකරණ ඵලදායීව භාවිත කරමින් අපේ දූ පුතුන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා කරවීමටත්, අනාගත ජයග්‍රහණ සඳහා ඔවුන් තුළ ශක්තිමත් පදනමක් ගොඩනැංවීමටත් මෙම වැඩසටහන දායක වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය

# අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

වර්තමාන රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ කියැවෙන "සැමට සම අධ්‍යාපන අවස්ථා ලබාදීම සහ ගුණ නැණ බල සපිරි සිසු පරපුරක්" රටට බිහි කිරීම සඳහා වර්තමාන රජය විසින් 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ වන්නේ "ළඟම පාසල හොඳම පාසල" ජාතික වැඩසටහන යි. මෙම වැඩසටහන යටතේ පාසල් පද්ධතියේ භෞතික හා ගුණාත්මක වශයෙන් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව ක්‍රියාත්මක වන එක් ප්‍රධාන ව්‍යාපෘතියක් වන්නේ ප්‍රාථමික පාසල් සංවර්ධනය යි. ප්‍රාථමික පාසල් සංවර්ධනය යටතේ දිවයිනේ සියලු ම පළාත්වල තෝරා ගත් පාසල්වල "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන" ඉදි කර ඇත. ක්‍රියාකාරී ප්‍රාථමික අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණින් මෙම "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන" තුළ ක්‍රියාකාරකම් කාමරයක් ස්ථාපිත කර ඇත.

ක්‍රියාකාරකම් කාමරය මඟින් සෑම සිසුවෙකුට ම ක්‍රියාකාරකම් පාදක ව තාක්ෂණික උපකරණ භාවිත කරමින් විනෝදජනක හා ක්‍රියාශීලී ක්‍රියාකාරකම් ඔස්සේ සතුටින් හා විනෝදයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වීමට හැකියාවක් ලැබෙනු ඇත. ක්‍රියාකාරී අධ්‍යාපනය යථාර්ථයක් බවට පත්කිරීම උදෙසා ක්‍රියාකාරකම් කාමරය ඉගෙනුම් ක්‍රියාවලියට ඵලදායීව යොදා ගන්නා ආකාරය පිළිබඳව විදුහල්පතිවරුන්ට මෙන්ම ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරුන්ට නිසි මඟපෙන්වීමක් අවශ්‍ය ය. එම මඟපෙන්වීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය සකස් කර ඇත.

මෙම උපදෙස් සංග්‍රහය මඟින් ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි ඉගෙනුම් උපකරණ හඳුන්වා දී ඇත. මෙම උපකරණ ප්‍රාථමික අධ්‍යාපන විෂය නිර්දේශය අනුව සියලු ම විෂයන් සඳහාත් සියලුම ශ්‍රේණි සඳහාත් යොදාගත හැකි පරිදි නිර්මාණය කර ඇත. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය ගුණාත්මකව හා ඵලදායීව ලබාදීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය උපකාරී වනු ඇත.

සියලු ම සිසුන්ගේ විභව්‍යතා උපරිම ලෙස සංවර්ධනය කර අනාගත අභියෝග ජය ගත හැකි සිසු පරපුරක් බිහි කිරීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය උපකාරී වනු ඇතැයි විශ්වාස කරමි.

මෙම උපදෙස් සංග්‍රහය සකස් කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාවටත්, ජාතික අධ්‍යාපන ආයතනයටත්, Plan International Sri Lanka ආයතනයටත් ස්තුතිය පිරිනමමි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ක්‍රියාකාරකම් කාමරය ඵලදායීව යොදා ගැනීම සඳහා අධ්‍යාපන පද්ධතියේ සියලු ම අංශවල පූර්ණ සහයෝගය ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමි.

වී.එස්. රාධක්‍රිෂ්ණන්.
අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

# අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

"සැමට ගුණාත්මක සම අධ්‍යාපන අවස්ථා අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් තුළ සහතික කිරීම මෙන්ම යාවජීව ඉගෙනුම ප්‍රවර්ධනය සඳහා අවස්ථා සැපයීම" යන ඉලක්කය වර්ෂ 2030 වනවිට සපුරා ගැනීම සඳහා 2015 දී පැවති තිරසර සංවර්ධන සමුළුවේ දී ශ්‍රී ලංකාව ද එකඟ වී ඇත. මෙම ගෝලීය ඉලක්කය ශ්‍රී ලංකා සන්දර්භය තුළ සපුරා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සුවිශාල කාර්යභාරයක් පැවරී ඇත. ඒ අනුව මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විශේෂ ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇති අතර "ළඟම පාසල හොඳම පාසල" සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතියි.

ගෝලීය පරමාර්ථ ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකාවේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවලට ගැළපෙන පරිදි අධ්‍යාපනය සකස් කිරීම සහ පාසල් පද්ධතියේ පවතින අසමානතා දුරලමින් සියලු දරුවන්ට සමාන අධ්‍යාපනයක් ලබාදීම යන අරමුණු මූලික කරගෙන 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. ඒ යටතේ ප්‍රාථමික පාසල්වල යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම මෙන්ම විදුහල්පති හා ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරමින් පවතී. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් කාමරයකින් හා කියවීම් කාමරයකින් සමන්විත "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක්" පාසල්වල ප්‍රාථමික අංශයට ලබා දී ඇත.

පූර්ණ පෞරුෂයක් සහිත පුද්ගලයකු බිහි කිරීම සඳහා වඩාත් තීරණාත්මක අවධිය වන්නේ ප්‍රාථමික අධ්‍යාපන අවධිය යි. ප්‍රාථමික සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා හා පෞරුෂ ලක්ෂණ බොහොමයක් ගොඩනැගෙන්නේත් හැඩගැසෙන්නේත් මේ අවධියේ ය. එබැවින් ළමා සංවර්ධනයේ සියලු අංශ සංවර්ධනය වන පරිද්දෙන් ප්‍රාථමික අධ්‍යාපනය සකස් වී තිබිය යුතු අතර ස්වයං ඉගෙනුමට, නිරීක්ෂණයට, ගවේෂණයට හා ආකල්ප සංවර්ධනයට අවස්ථා ප්‍රාථමික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ තිබිය යුතු ය. මෙම තත්ත්වය 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂය නිර්දේශය මගින් වැඩිදුරටත් අවධාරණය කර ඇති අතර, එය ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් කාමරය මගින් තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

ක්‍රියාකාරකම් කාමරය, ප්‍රාථමික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඵලදායීව යොදා ගැනීම සඳහා උපදෙස් සංග්‍රහයක් සකස් කිරීමට පියවර ගැනීම ඉතාමත් ම කාලෝචිත ය. මෙම උපදෙස් සංග්‍රහය මගින් පාසල්වල විදුහල්පතිවරුන්ට සහ ප්‍රාථමික ගුරුවරුන්ට ක්‍රියාකාරී ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා, ක්‍රියාකාරකම් කාමරය ඵලදායීව යොද ගැනීමට සාර්ථක මඟපෙන්වීමක් කරනු ඇත.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ PDF දේ ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..

# අතිරේක ලේකම්තුමාගේ පණිවිඩය

රටක සංවර්ධනයේ පදනම ගුණාත්මක අධ්‍යාපනයයි. සියලු ම දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය මෙන් ම අධ්‍යාපනයේ සමාන අවස්ථා ලබා දෙමින් ගුණාත්මක අධ්‍යාපනයක් තවදුරටත් උසස් මට්ටමකින් දැයේ දරුවන් වෙත ලබාදීම සඳහා "ළඟම පාසල හොඳම පාසල" විශේෂ ව්‍යාපෘතිය නව රජය විසින් හඳුන්වා දී තිබේ.

වර්ෂ 2030 වන විට සපුරා ගත යුතු තිරසර සංවර්ධනයේ ඉලක්කයන්ට සමගාමී ව සැමට සම අධ්‍යාපන අවස්ථා, අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම, යාවජීව ඉගෙනුම ප්‍රවර්ධනය, 21 වන සියවසට ගැළපෙන අධ්‍යාපනය ආදී අවශ්‍යතා ලාංකේය අධ්‍යාපන පද්ධතිය තුළින් සපුරා ගැනීමට "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ.

පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම විදුහල්පතිවරුන් හා ගුරුවරුන් බලවන්තකරණය සඳහා වූ පුහුණු වැඩසටහන් මෙම ව්‍යාපෘතිය යටතේ පාසල්වල ද්විතීයික හා ප්‍රාථමික අධ්‍යාපන යන අංශ දෙක සඳහා ම ක්‍රියාත්මක වේ.

එසේ ම පාසල්වල ප්‍රාථමික අංශ සඳහා ඉදිකරන ලද "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය" ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්ට ක්‍රියාකාරී අධ්‍යාපනය සඳහා මහඟු පිටිවහලකි. වර්තමාන සමාජයේ දෙමාපියන්ගේ විභාග කේන්ද්‍රීය තරගකාරී අධ්‍යාපන අපේක්ෂාවන් තුළ ප්‍රාථමික සිසුන්ගේ ළමා කාලය ඔවුන්ට අහිමි වී තිබේ. එසේම මනසට දරාගත නොහැකි විෂය කරුණු පිරුණු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ප්‍රාථමික සිසුන් පසුවන්නේ සතුටින් හා කැමැත්තෙන් නොවේ. මෙම තත්ත්වය ක්‍රියාකාරකම් පාදක, ආකර්ෂණීය, ප්‍රියජනක ළමා මිතුරු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් තුළින් වෙනස් කළ හැකි ය. ඒ සඳහා පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන අංශයට "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය" හරහා ලැබුණු ක්‍රියාකාරකම් කාමරය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

ක්‍රියාකාරකම් කාමරය ප්‍රයෝජනයට ගනිමින් සිසු විවිධත්වයට ගැළපෙන විවිධ ක්‍රියාකාරකම් තාක්ෂණය ද මුසු කරමින් නිර්මාණශීලීව හා සිසුන්ට විනෝදයක් ලැබෙන අයුරින් ක්‍රියාත්මක කිරීමට ප්‍රාථමික ගුරුවරුන් විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි. මේ සඳහා උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම ඵලදායී මෙන්ම ඉතා ප්‍රයෝජනවත් කාර්යයකි. ක්‍රියාකාරකම් කාමරය තුළින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රීතිමත් ඉගෙනුම් අවස්ථා හා ක්‍රියාකාරකම් ඇතුළත් කොට මෙවැනි උපදෙස් සංග්‍රහයක් නිර්මාණය කිරීම, ක්‍රියාකාරකම් කාමරයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉමහත් රුකුලක් වනු ඇත.

"ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනය" යන්න අර්ථ සම්පන්න කරමින් ක්‍රියාශීලී දරු පරපුරක් ප්‍රාථමික අධ්‍යාපනය තුළින් බිහි කිරීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් විසින් ඵලදායීව භාවිත කරනු ඇතැයි විශ්වාස කරමි.

ඒ.එස්. හේවගේ,
අතිරේක ලේකම් (පාසල් කටයුතු)

# ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ දේශීය අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

ළමා මූලික ප්‍රජා සංවර්ධන ප්‍රවේශයක් තුළින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ප්ලෑන් ඉන්ටර්නැෂනල් ආයතනයේ වැඩසටහන් අතර අධ්‍යාපන වැඩසටහනට ලැබෙනුයේ සුවිශේෂී ස්ථානයකි. විවිධත්වය, මානව අයිතීන් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අගයන සමාජයක ළමයින් සහ යෞවනයින් විශේෂයෙන් ගැහැණු ළමයින් ඔවුන්ගේ තිරසාර සංවර්ධනය සහ තම අයිතීන් සාක්ෂාත් කරගැනීම සඳහා සක්‍රිය ලෙස නායකත්වය ගන්නා පරිසරයක් නිර්මාණය කිරීමට ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රීලංකා ආයතනය විවිධ පාර්ශවකරුවන් සමග හවුල්කාරිත්වයෙන් කටයුතු කරයි. අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලාංකික දරුවන් සැමට සමාන අයුරින් ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා අප ආයතනය අධ්‍යාපන අමාත්‍යාංශය සමග ජාතික මට්ටමෙන්, පළාත් මට්ටමෙන් සහ කලාපීය මට්ටමෙන් ශක්තිමත් හවුල්කාරීත්වයක් ගොඩනගා ගනිමින් වැඩසටහන් දියත් කරනු ලබයි.

විනෝදජනක ක්‍රියාකාරකම් තුළින් දරුවන්ට ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීමටත්, ශිෂ්‍ය කේන්ද්‍රීය ළමා මිතුරු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ශක්තිමත් කිරීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය ගනු ලබන මෙම උත්සාහයට හවුල්කාර සංවිධානයක් ලෙස කටයුතු කිරීමට ලැබීම විශේෂ අවස්ථාවක් ලෙස සලකමි. ක්‍රියාකාරකම් පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක් තුළින් දරුවන්ට අධ්‍යාපනයෙන් ලැබිය යුතු මූලික සංකල්ප ඉතා පහසුවෙන් අවබෝධ කරගත හැකි වනු ඇත. එමෙන්ම දරුවන් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය විනය ගැන්වීම මගින් කණ්ඩායමක් ලෙස එකට කටයුතු කිරීම, අන් අයට ගරු කිරීම, තම වාරය පැමිණෙන තුරු ඉවසා සිටීම වැනි විශේෂ ජීවන කුසලතා දරුවන් ළඟා කරගනු ඇත. අසුන්ගත ඉගැන්වීමේ ක්‍රමවේදයකට වඩා මේ මගින් දරුවන් තුළ පවතින විශේෂ ලක්ෂණ සහ සෙමෙන් ඉගෙන ගන්නා දරුවන් හඳුනා ගැනීමට ගුරුවරයාට ඉතා පහසු වනු ඇත.

මෙම උපදෙස් සංග්‍රහය සම්පාදනය කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයටත්, ජාතික අධ්‍යාපන ආයතනයටත්, ප්ලෑන් ඉන්ටර්නැෂනල් ආයතනයේ කාර්යය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමි. මෙම උපදෙස් සංග්‍රහය තුළින් ප්‍රාථමික අංශය තුළ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමටත් ඒ මගින් දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමටත් හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

ඇනා මරී හැග්ලන්ඩ් හීලස්,
දේශීය අධ්‍යක්ෂ,
ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රීලංකා.

# හැඳින්වීම

දරුවකුගේ කායික හා මානසික සංවර්ධනයේ වැදගත් ස්ථානයක් හිමිවන ප්‍රාථමික අධ්‍යාපනය ඵලදායී හා ගුණාත්මක විය යුතු ය. ක්‍රියාකාරකම් ඇසුරෙන් කෙරෙන ඉගෙනුමෙන් දරුවකුගේ බුද්ධි සංවර්ධනය, යහපත් ආකල්ප සංවර්ධනය, සන්නිවේදන කුසලතා සංවර්ධනය, ඉන්ද්‍රිය සමායෝජනය, නිර්මාණශීලී චින්තනය වැඩිදියුණු වීම හා පරිකල්පන ශක්තිය සංවර්ධනය වීම සිදුවේ.

ප්‍රාථමික අවධියේ සිසුහු ක්‍රියාකාරකම්වල නිරතවෙමින් පංචේන්ද්‍රියන් තියුණු ලෙස භාවිතයට ගනිමින් නිරීක්ෂණයෙන්, පරීක්ෂණයෙන් හා ගවේෂණයෙන් බොහෝ අත්දැකීම් ලබා ගනිති. එබැවින් ඔවුන්ට පංචේන්ද්‍රියයන් මගින් අත්දැකීම් ලබා ගත හැකි ආකාරයට ක්‍රියාකාරකම්වල නිරතවෙමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම අත්‍යවශ්‍ය වේ.

ක්‍රියාකාරී අධ්‍යාපනයට ප්‍රමුඛත්වයක් ලබා දී ඇති ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රධාන අවධි තුනකින් සමන්විත වේ. එහි පළමු ප්‍රධාන අවධිය පළමුවන හා දෙවන ශ්‍රේණිවලින් ද, දෙවන ප්‍රධාන අවධිය තුන්වන හා හතරවන ශ්‍රේණිවලින් ද, තුන්වන ප්‍රධාන අවධිය පස්වන ශ්‍රේණියෙන් ද සමන්විත ය. මෙම ප්‍රධාන අවධි තුනෙහිදී ම ක්‍රියාත්මක වන්නේ නිපුණතා පාදක විෂය මාලාවකි. සෑම ප්‍රධාන අවධියක් අවසානයේ දී ම සියලු ම සිසුන් විසින් ප්‍රවීණතාව ළඟා කරගත යුතු, එනම් අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු නිපුණතා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ. සෑම ශ්‍රේණියකදී ම එක් එක් විෂයයට අදාළ ව පන්ති කාමරයේ සිටින සිසුන්ගෙන් බහුතරයක් අත්පත් කරගත යුතු නිපුණතා අභිමත නිපුණතා ලෙසින් හැඳින්වේ. සියලු ම සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලටත්, බහුතරයක් සිසුන් අභිමත ඉගෙනුම් නිපුණතාවලටත් ළඟා කරවීම ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වන ගුරුවරුන්ගේ වගකීම වේ.

එක ම පන්තියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වුව ද කායික හා මානසික සංවර්ධන මට්ටම් විවිධ වේ. එනම් ඔවුන්ගේ බුද්ධි මට්ටම්, චර්යාවන්, ඉගෙනුම් හැකියාවන්, ඉගෙනුම් ශෛලීන්, රුචිකත්වයන් දෙස බැලූ කල සිසුන් එකිනෙකාගෙන් වෙනස් වන බව පැහැදිලිය. වර්තමානයේ දරුවන් සම්බන්ධව කරන ලද විවිධ පර්යේෂණවලින් අනාවරණය වී ඇති ආකාරයට ඇතැම් දරුවන් විවිධ ආකාරයේ ඉගෙනුම් දුෂ්කරතාවලින් යුක්ත වේ. එමෙන් ම එක් එක් ශිෂ්‍යයා කරුණු ග්‍රහණය කරගන්නා ප්‍රමාණයන්හි ද විවිධ වෙනස්කම් දක්නට ලැබේ. එබැවින් දරුවන් නිවැරදිව හඳුනාගෙන, ඔවුන්ගේ ඉගෙනුම් දුෂ්කරතා අවම කිරීමට විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් ය. එමෙන් ම සමහර අවස්ථාවල සිසුන්ට ප්‍රියජනක නොවන ඉගෙනුම් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම නිසා ප්‍රාථමික අවධියේ සිසුන් ඉගෙනුමට මැළිකමක් දක්වන අතර පාසල් පැමිණීමට ද මැළිකමක් හා අකමැත්තක් දක්වන තත්ත්වයක් ඇත. ඒ හේතුවෙන් ඔවුන් පසුකාලීනව විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහෙන්නන් බවට පත් විය හැකි ය. එවැනි සිසුන් පාසල වෙත ආකර්ෂණය කරගැනීම සඳහා පාසල තුළ විවිධ විකල්ප ක්‍රියාමාර්ග සැලසුම් කළ යුතු ය.

ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය, සැලසුම් සහගත සෙල්ලම් හා විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් හා අසුන්ගත වැඩවලින් සමන්විත වේ. ළමා සංවර්ධන අවධි සැලකිල්ලට ගෙන පළමුවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් ද, දෙවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම්, ක්‍රියාකාරකම් හා අසුන්ගත වැඩවල සමබර සංකලනයක් ද, තුන්වන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් හා විනෝදජනක වැඩවලට වඩා අසුන්ගත වැඩ හා ක්‍රියාකාරකම් සඳහා වැඩි නැඹුරුතාවක් ද ඇති වන ලෙසින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ඇත.

ප්‍රාථමික පන්තිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, ක්‍රියාකාරකම්වලින් සමන්විතවීම අත්‍යවශ්‍ය නමුත් ඇතැම් ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සැලසුම් කිරීමේ දී විවිධ ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණදීමට ගුරුවරයාට සිදු විය හැකි ය. පන්ති කාමරය තුළ ශිෂ්‍ය සංඛ්‍යාව අධික වීම නිසා ඉඩකඩ සීමිත වීම, ආසන්න පන්ති කාමරවල ඇති ඝෝෂාකාරී තත්ත්වය නිසා පන්ති කාමරවල නිදහස් ක්‍රියාකාරකම් සිදු කිරීමට බාධා පැමිණීම, එක් පන්තියක් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකමට අනෙක් පන්ති කාමරවල දරුවන්ගේ ඇති කැමැත්ත නිසා එම දරුවන්ගේ අවධානය යොමුවීම, වෙනත් පන්තිවල සිසුන්ගේ අවධානයට ලක්වීමට සමහර සිසුන් දක්වන අකැමැත්ත හා සබකෝලය වැනි හේතු නිසා සමහර සිසුන්ගේ ක්‍රියාකාරකම් සඳහා සහභාගිත්වය අවම වීම වැනි කරුණු මෙම ගැටලු සහගත තත්ත්වයන් ලෙස හැඳින්විය හැකි ය. එසේම සමහර ක්‍රියාකාරකම් සඳහා පන්ති කාමරයෙන් පිටත එළිමහන් පරිසරය යොදා ගත හැකි නමුත් සමහර ක්‍රියාකාරකම් එසේ එළිමහන් පරිසරයක ක්‍රියාත්මක කිරීම අපහසු වේ. එබැවින් පන්ති කාමරය තුළ හා එළිමහන් පරිසරය තුළ සිදු කිරීමට අපහසු වන, නමුත් සිසුන් අනිවාර්යයෙන්ම යෙදවිය යුතු ක්‍රියාකාරකම් වඩාත් සැලසුම් සහගතව, ක්‍රමවත්ව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට ඒ සඳහා ම වෙන් වූ ක්‍රියාකාරකම් කාමරයක් තිබීම අත්‍යවශ්‍ය වන නමුත් බොහෝ පාසල්වල ක්‍රියාකාරකම් කාමරයක් පවත්වා ගැනීම විධිමත්ව හා සාර්ථක ලෙස ක්‍රියාත්මක වී නැත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, විවිධ ක්‍රියාකාරකම් ඇසුරෙන් සිදු කිරීමට ක්‍රියාකාරකම් කාමරයක් ඵලදායි ලෙස පවත්වා ගැනීම ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා ප්‍රමුඛ අවශ්‍යතාවකි.

2016 වර්ෂයේ සිට රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන "ළඟම පාසල හොඳම පාසල" නව ජාතික අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහනෙහි එක් අංගයක් ලෙස ක්‍රියාකාරකම් කාමරයක් හා කියවීම් කාමරයක් සහිත "ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක්" ප්‍රාථමික පාසල්වලට ලබා දීමට කටයුතු කර ඇත.

මෙම ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයෙහි ඇති ක්‍රියාකාරකම් කාමරය තුළ සිදු කළ හැකි ආදර්ශ ඉගෙනුම් ක්‍රියාකාරකම් කිහිපයක් හඳුන්වාදීම මෙම උපදෙස් සංග්‍රහය මගින් සිදු කර ඇත. මෙම ආදර්ශ ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපන විෂය නිර්දේශයට අදාළ ව පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා අදළ නිපුණතා කරා සිසුන් ළඟා කරවීම මෙන් ම සිසුන්ගේ ආකල්ප සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරවීම ඉලක්ක කර ගෙන සකස් කර ඇත. එම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ සකස් කර ගැනීමට අදළ උපදෙස් ද මෙහි දක්වා ඇත. මෙම උපකරණ සිසුන්ට ආකර්ෂණීය වන ලෙස මනා නිමවුමකින් යුක්තව සකස් කර ගත යුතු වේ. එසේ ම සෑම ක්‍රියාකාරකමක් සඳහා ම විකාශන අවස්ථා ඉදිරිපත් කර ඇත. ඒ හේතුවෙන් එක් උපකරණයක් භාවිතයෙන් මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ආගම වැනි විෂයයන් මෙන් ම දෙවන ජාතික භාෂාව හා ඉංග්‍රීසි භාෂාව සඳහා ද ක්‍රියාකාරකම් සැලසුම් කර ගත හැකි වේ. එසේ ම අදාළ අවස්ථාවල දී තාක්ෂණය භාවිත කළ යුතු වේ. මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර ඇති විවිධ සංයුක්ත තැටි මෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව විසින් ප්‍රාථමික අධ්‍යාපන විෂය නිර්දේශවලට අනුව සකස් කර ඇති විවිධ ක්‍රියාකාරකම් ද අදාළ ලෙස යොදගත හැකි වේ. මෙම උපදෙස් සංග්‍රහයෙහි දක්වා ඇත්තේ උදහරණ කිහිපයක් පමණි. මෙම ක්‍රියාකාරකම් මෙන් ම වඩාත් නිර්මාණශීලී වෙනත් උචිත නව ක්‍රියාකාරකම් සැලසුම් කර සිසුන් සමග ක්‍රියාත්මක කිරීම තුළින් වඩාත් ප්‍රියජනක මෙන් ම බොහෝ ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා සිසුනට මෙන් ම ගුරුභවතුන්ට ද අවස්ථා සැලසෙයි.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

# ක්‍රියාකාරකම් කාමරය භාවිතය

පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා සියලු ම විෂයයන්හි විෂය නිර්දේශ ආවරණය වන ලෙස ක්‍රියාකාරකම් කාමරය තුළ සිදු කළ යුතු ක්‍රියාකාරකම් හඳුනා ගත යුතු ය. එම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ ප්‍රාථමික අංශයේ සියලු ම ගුරුවරුන්ගේ සහභාගිත්වයෙන් සකස් කර ගත යුතු වේ. මේ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම උපදෙස් සංග්‍රහය මගින් දක්වා ඇත.

ක්‍රියාකාරකම් කාමරය භාවිත කිරීම විධිමත්ව සිදුවීම සඳහා සියලු ම ප්‍රාථමික පන්ති ආවරණය වන ලෙස කාලසටහනක් සකස් කළ යුතුය. එසේම එය ක්‍රියාත්මක වීම නියාමනය සඳහා සුදුසු ක්‍රමවේද පාසල විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය. පාසලේ අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේ දී ද මෙම ක්‍රියාකාරකම් කාමරයේ ක්‍රියාවලිය නියාමනයට ලක් විය යුතු අතර ඒ පිළිබඳ ව වාර්තා පවත්වා ගත යුතුය.

පන්තියේ සියලු ම සිසුන්ට නිදහසේ ක්‍රියාකාරකම්වල යෙදීමට හැකි වන පරිදි ප්‍රමාණවත් හිස් ඉඩ ප්‍රමාණයක් ක්‍රියාකාරකම් කාමරය තුළ පැවතිය යුතු ය. ජලය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා විවිධ ආහාර වර්ග පිළියෙල කිරීම් වැනි දෑ සඳහා විවෘත කොරිඩෝව යොදාගත හැකි වේ. එදිනෙදා සිදුකරන ක්‍රියාකාරකම්වලට අදාළ ව ආකර්ෂණීය ලෙස සකස් කරගත් ප්‍රදර්ශන පුවරු මගින් ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් සකසා ගැනීම මෙන්ම සුදුසු පරිදි තාක්ෂණය භාවිත කිරීම සඳහා ද සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ.

ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය සඳහා මෙම ක්‍රියාකාරකම් කාමරය ඉතා ඵලදායීව හා කාර්යක්ෂමව නිසි කළමනාකරණයකින් යුක්තව පවත්වා ගැනීම විදුහල්පතිවරයාගේ වගකීම යි.

# ක්‍රියාකාරකම් පෙළගැස්ම

01. විස්කම් පෙති මල
02. සංඛ්‍යා රටා පැදුර
03. අකුරු අවාන
04. සංඛ්‍යා අවාන
05. කියවන්නාගේ නාට්‍යාගාරය
06. පලඳනා කට්ටලය
07. සිරිමත් ගැළපුම
08. ස්ථානීය අගය පෙත
09. විස්කම් පැදුර
10. හෝරා චක්‍රය
11. භ්‍රමණ රෝදය
12. ගණිත විනිවිදක පුවරුව
13. රූකඩ රඟහල
14. සෙවණැලි රූපාගාරය
15. භාග මංජුසාව
16. ඉලක්ක පුවරුව
17. කැරකෙන බමරය
18. සිරිමත් පුවරුව
19. පන්දු ඇසුරුම

# විස්කම් පෙති මල





# විස්කම් පෙති මල

**නිපුණතා** :- සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳයි
සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි

**ස්වරූපය** :- කේවල / යුගල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ෆෝමිකා බෝඩ් එකක්
- වෙල්වට් / ෆ්ලෙක්ස් රෙද්දක්
- විනිවිද පෙනෙන ඝනකම් ඉටි කොළයක්
- ඉදිකටු, නූල්
- කතුරක්
- කාඩ්බෝඩ්
- මැලියම්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**
- විෂ්කම්භය 30cm ක් වන සේ වෘත්තයක් ෆෝමිකා තහඩුවකින් කපා වෙන් කරගන්න.




**II පියවර :**
- විෂ්කම්භය 30cm ක් වන සේ වෘත්ත දෙකක් ඝන ඉටි කොළයකින් හා වෙල්වට්/ෆ්ලෙක්ස් රෙද්දකින් කපා වෙන් කරගන්න.



### III පියවර :

- වෙල්වට් / ෆ්ලෙක්ස් වෘත්තය මත ඝන ඉටි කොළ වෘත්තය තබා රූපයේ කඩ ඉරිවලින් දක්වා ඇති රේඛා ඔස්සේ පමණක් මැහුම් යොදන්න. පෙති අටක් රිංගවිය හැකි කුහර අටක් සහිත වෘත්තයක් දැන් ලැබෙනු ඇත.




- ඉහත සාදා ගත් ව්‍යුහය ෆෝමිකා තහඩුව මත හොඳින් අලවා ගන්න.



- මෙම රවුම අක්ෂයක් වටා තිරස් තැටියක් ලෙස කරකැවිය හැකි වන සේ සිරස් ආධාරකයක් මත සවි කරගන්න.



**IV පියවර :**

- එම කුහරවල විවෘත මුඛ තුළින් රිංගවිය හැකි වන සේ පහත රූපයේ දැක්වෙන පරිමාණයට අනුව රතු පැහැති හැඩතල 8ක් කපා ගන්න.




**V පියවර :**

- පහත රූපයේ දැක්වෙන පරිමාණයට අනුව කහ පැහැති හැඩතල (මල් පෙති) 8ක් ද කපා ගන්න.




**ක්‍රියාකාරකම :-** සංඛ්‍යා බන්ධන හඳුන්වාදීම

**I පියවර :**

- රතු පැහැති වර්ණය සහිත හැඩතල මත එකතුව 9ට අඩු වන සේ සංඛ්‍යා බන්ධන ලියන්න.
  (සැ.යු:- නිවැරදි අංග හා ප්‍රමාණ සහිත ඉලක්කම් විය යුතු යි.)

**II පියවර :**

- කහ පැහැති වර්ණය සහිත හැඩතල මත අංක 1 සිට 9 තෙක් නිවැරදිව සංඛ්‍යාංක ලියන්න.

**III පියවර :**

- සංඛ්‍යා බන්ධන ලියූ රතු පැහැති හැඩතල, වෘත්තයෙහි මැද ඇති නූල්වලින් මායිම් වන, ඉටි කොළ හා ෆ්ලෙක්ස් වෘත්තය අතර ඇති කුහර තුළට විවෘත මුඛ ඔස්සේ ඇතුළු කරන්න.



**IV පියවර :**

- වෘත්තයෙහි මැද ඇති එක් එක් සංඛ්‍යා බන්ධනවලට අදාළ නිවැරදි සංඛ්‍යාව සටහන් පෙත්ත කහ පැහැති මල් පෙති අතුරින් තේරීමටත්, එය වෘත්තයෙහි අදාළ කුහරය තුළට රිංගවමින් නිවැරදි සංඛ්‍යා බන්ධන සහිත මලක් සම්පූර්ණ කිරීමටත් සිසුන්ට පවරන්න.






**විෂය ක්ෂේත්‍රය :** මව්බස

**විකාශන අවස්ථා 01**

**නිපුණතාව :** කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.

**ක්‍රියාකාරකම :-**

I පියවර : රතු පැහැති හැඩතලවල පිල්ලේ නම ලියන්න.
II පියවර : කහ පැහැති හැඩතලවල අදාළ පිල්ල යෙදුණු අකුරු සහිත වචන ලියන්න.
III පියවර : රතු පැහැති හැඩතල කුහර 8 තුළ රඳවන්න.
IV පියවර : රතු පැහැති හැඩතලවල සඳහන් පිලි යෙදුණු අකුරු සහිත වචන කහ පැහැති හැඩතලවලින් තෝරා අදාළ කුහර තුළ රැඳවීමට සිසුන් යොමු කරවන්න.
V පියවර : එසේ රැඳවූ වචන කියවීමට සිසුන්ට පවරන්න.




**විකාශන අවස්ථා 02**

**නිපුණතාව :** සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි.

**ක්‍රියාකාරකම :-**

I පියවර : රතු පැහැති හැඩතලවල එක් එක් ප්‍රධාන අවධිවලට නිර්දේශිත වචන කිහිපයක් ලියන්න.
II පියවර : කහ පැහැති හැඩතලවල එකී වචනවලට සමානාර්ථ / විරුද්ධාර්ථ පද ලියන්න.
III පියවර : රතු පැහැති හැඩතල කුහර 8 තුළ රඳවන්න.
IV පියවර : රතු පැහැති හැඩතලවල සඳහන් වචනවලට සමානාර්ථ / විරුද්ධාර්ථ පද ඇතුළත් කහ පැහැති හැඩතල තෝරා අදාළ කුහර තුළ රැඳවීමට සිසුන් යොමු කරවන්න.
V පියවර : එසේ රැඳවූ වචන කියවීමට සිසුන්ට පවරන්න.

 

**විකාශන අවස්ථා 03**

**නිපුණතාව :** භාෂාමය යෙදුම් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



## විකාශන අවස්ථා 04

**නිපුණතාව :** භාෂාමය යෙදුම් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



**විෂය ක්ෂේත්‍රය :** පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## විකාශන අවස්ථා 05

**තේමාව :** වත්තට එන සත්තු.

**නිපුණතාව :** අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



**විකාශන අවස්ථා 06**

**තේමාව :** අප අවට සතුන්

**නිපුණතාව :** සත්ත්ව චරිත නිරූපණය කරමින් ගායනා හා රංගනවල යෙදෙයි.

**ක්‍රියාකාරකම** :- පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



**විකාශන අවස්ථා 07**

**තේමාව :** අපේ අතීත විත්ති

**නිපුණතාව :** ඓතිහාසික වටිනාකමකින් යුත් පුද්ගලයන් පිළිබඳ තොරතුරු රැස්කර වාර්තා කරයි.

**ක්‍රියාකාරකම** :- පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



## විකාශන අවස්ථා 08

**නිපුණතාව :** විවිධ වෘත්තීන් හා බැඳුණු වචන කියවයි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.





## විකාශන අවස්ථා 09

**නිපුණතාව :** සමාජමය ආකල්ප හා කුසලතා සංවර්ධනය කරගනියි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



## විකාශන අවස්ථා 10

**නිපුණතාව :** අවට පරිසරයේ වෙසෙන සතුන් අතර ඇති විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.

**ක්‍රියාකාරකම :-** පළමුවන හා දෙවන විකාශන අවස්ථාවන්හි සඳහන් පියවර අනුගමනය කරන්න.



# සංඛ්‍යා රටා පැදුර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 100 | 99 | 98 | 97 | 96 | 95 | 94 | 93 | 92 | 91 |
| 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 80 | 79 | 78 | 77 | 76 | 75 | 74 | 73 | 72 | 71 |
| 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |
| 60 | 59 | 58 | 57 | 56 | 55 | 54 | 53 | 52 | 51 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |
| 40 | 39 | 38 | 37 | 36 | 35 | 34 | 33 | 32 | 31 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 20 | 19 | 18 | 17 | 16 | 15 | 14 | 13 | 12 | 11 |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |



# සංඛ්‍යා රටා පැදුර

**නිපුණතාව** :- 100 තෙක් සංඛ්‍යා කියවයි. ලියයි.

**ස්වරූපය** :- කේවල / යුගල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :- ● පහත නිර්දේශ යටතේ මුද්‍රිත ඩිජිටල් ඵලකයක්

**උපකරණ සැකැස්ම :-**

**I පියවර :**

30 cm × 30 cm ප්‍රමාණයෙන් යුත් සමචතුරස්‍රාකාර කොටු සියයක අංක 1-100 තෙක් ඉලක්කම් යෙදූ ඩිජිටල් මුද්‍රිත ඵලකයක් (පැදුරක්) මුද්‍රණය කරගන්න.

(සැ.යු. :- දී ඇති වර්ණ රටාවට සමාන වර්ණ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ හඳුන්වා දී ඇති ඉලක්කම් භාවිත කළ යුතු වේ.)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 100 | 99 | 98 | 97 | 96 | 95 | 94 | 93 | 92 | 91 |
| 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 80 | 79 | 78 | 77 | 76 | 75 | 74 | 73 | 72 | 71 |
| 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |
| 60 | 59 | 58 | 57 | 56 | 55 | 54 | 53 | 52 | 51 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |
| 40 | 39 | 38 | 37 | 36 | 35 | 34 | 33 | 32 | 31 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 20 | 19 | 18 | 17 | 16 | 15 | 14 | 13 | 12 | 11 |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

**ක්‍රියාකාරකම :-**

- ගුරුවරයා / ගුරුවරිය පවසන සංඛ්‍යා නාමයට අනුව සංඛ්‍යා පැදුරේ අදාළ සංඛ්‍යා මත සිටගැනීමට යොමු කරන්න. තමා සිටින ඉලක්කමට අදාළ සංඛ්‍යා නාමය නිවැරදිව පැවසීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

- එක් සිසුවකුට සංඛ්‍යා පැදුර මත වූ කොටුවක් මත සිටගැනීමට පවසන්න. තවත් සිසුන් දෙදෙනෙකුට එම සිසුවා දෙපස ඇති කොටුවල සිටගැනීමට සලස්වන්න. ඒ අනුව මැද සිටින සිසුවා සිටගත් කොටුවේ සංඛ්‍යාවට පෙර සංඛ්‍යාවට අදාළ කොටුවේ සිටින සිසුවාගේ නමත් පසු සංඛ්‍යාවට අදාළ කොටුවේ සිටින සිසුවාගේ නමත් විමසන්න. ඒ අනුව යම් සංඛ්‍යාවකට පෙර හා පසු සංඛ්‍යා පිළිබඳ අවබෝධය තහවුරු කරන්න.

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරගන්න. කණ්ඩායම් දෙකෙන් ම ඉත්තන් ලෙස සිසුන් දෙදෙනෙකු පත් කරගන්න. කණ්ඩායම් දෙකට දාදු කැටයක් ලබා දෙන්න.

- එක් එක් කණ්ඩායමට දාදු කැටය උඩ දැමීමට අවස්ථාව ලබාදෙන්න. දාදු කැටයේ ලැබෙන අගය අනුව සංඛ්‍යා පැදුර මත සිටගත් සිසුවාට ඉදිරියට ගමන් කිරීමට අවස්ථාව සලස්වන්න. ඉක්මනින් ම 100 සංඛ්‍යාව වෙත ළඟා වූ සිසුවා (ඉත්තා) හිමි කණ්ඩායම ජයග්‍රහණය කරනු ඇත.

## විකාශන අවස්ථා 01

**නිපුණතාව :-** සංඛ්‍යා රටා ගොඩ නඟයි.

**ක්‍රියාකාරකම :-**

නම් කරන ලද සංඛ්‍යාවක සිට සංඛ්‍යා පැදුර මත පෙරට හෝ පසු පසට පොදු අන්තරය 2 වන රටාවට අදාළ කොටු මත පැන පැන යෑමට සිසුන් යොමු කරන්න. මේ අනුව 3, 4, 5 හා 10 ආදී පොදු අන්තරයක් සහිත රටාවක් අනුව සංඛ්‍යා පැදුර මත පැන පැන යාමට පවරන්න.

## විකාශන අවස්ථා 02

**නිපුණතාව :-** 100ට අඩු ඕනෑ ම සංඛ්‍යා 3ක් සසඳා පටිපාටිගත කරයි.

**ක්‍රියාකාරකම :-**

- සිසුන් තිදෙනා බැගින් කණ්ඩායම් කරන්න.

- ගුරුවරයා විසින් නිකුත් කරන නලා හඬට අනුව සිසුන් තිදෙනාට සංඛ්‍යා සහිත කොටු මත සිටගැනීමට පවරන්න.

- කණ්ඩායමේ තිදෙනා එසේ සංඛ්‍යා මත සිටගත් පසු එම සංඛ්‍යා තුන අතරින් තමාට හිමි වූයේ අඩු ම සංඛ්‍යාව ද, ඊට වඩා වැඩි සංඛ්‍යාව ද, විශාල ම සංඛ්‍යාව ද යන්න හඬ නඟා පැවසීමට යොමු කරවන්න.

# අකුරු අවාන





# අකුරු අවාන

**නිපුණතාව** :- කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.

**ස්වරූපය** :- කේවල

**අවශ්‍ය දෑ** :-
- විවිධ වර්ණ කාඩ්බෝඩ්
- මාකර් පෑන්
- ඇණ
- කතුරක්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**
- විවිධ වර්ණ ඝනකම් කඩදාසිවලින් පහත දැක්වෙන අන්දමේ හැඩ කපා වෙන් කරගන්න.
- එම හැඩ පෙතිවල පුළුල් කෙළවරෙහි සිංහල වර්ණ මාලාවේ පිලි රහිත අක්ෂර නිවැරදි අංග, ප්‍රමාණ සහිතව ලියා ගන්න.
- මෙම පෙති ලැමිනේට් කරගන්න.




**II පියවර :**
- පෙතිවල පටු කෙළවරවල් එක මත එක අතිපිහිත වන අයුරින් තබා අමුණා අවානක් අයුරින් සකසා ගන්න. (එසේ ඇමිණිය යුතු වන්නේ අවානෙහි පෙති එකිනෙකට සාපේක්ෂව චලනය කළ හැකි අයුරිනි. මෙසේ එක් අවානකට අකුරු 15ක් පමණ වන සේ අකුරු අවාන් කිහිපයක් සකසා ගත හැකි ය.)



**ක්‍රියාකාරකම :-**

- අවානෙහි අකුරු සහිත පෙති එකකට එකක් සාපේක්ෂව චලනය කරවමින් පිලි රහිත අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන සිසුන් ලවා නිර්මාණය කරවන්න.







**විකාශන අවස්ථා 01**

**නිපුණතාව :-** කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.

**උපකරණ සැකැස්ම :-** කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** මෙම අකුරු අවාන් ඇසුරෙන් සිංහල වර්ණ මාලාවේ පළමු ප්‍රධාන අවධියට යෝජිත මධ්‍ය අක්ෂර, ආරෝහණ අක්ෂර, අවරෝහණ අක්ෂර අඩංගු අවානෙහි පෙති එකට ගොනු කරවීමට සිසුන් යොමු කරවන්න.



## විකාශන අවස්ථා 02

**නිපුණතාව** :- කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.

**උපකරණ සැකැස්ම** :- කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම** :- යෝජිත පිලි යෙදූ අකුරු හා පිලි රහිත අකුරු සහිත අවාන් පෙති මිශ්‍රව යෙදූ අවාන් සකස් කර ගැනීමෙන් පිලි සහිත අකුරු දෙකේ හා තුනේ වචන සිසුන් ලවා නිර්මාණය කරවන්න.







**සැ.යු.** :- මෙවැනි අකුරු අවාන් සැකසීමේ දී පිලි සංයෝජනය මගින් වැඩි ම වචන ගණනක් නිර්මාණය කිරීමට අවස්ථා සැලසෙන අන්දමින් අවාන් පෙති සැලසුම් කිරීමට වගබලා ගත යුතු වේ.

# සංඛ්‍යා අවාන






# සංඛ්‍යා අවාන

**නිපුණතාව** :- ඉලක්කම් හතර තෙක් සංඛ්‍යා අවබෝධය ලබා එම සංඛ්‍යා පටිපාටිගත කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- විවිධ වර්ණ කාඩ්බෝඩ්
- මාකර් පෑන්
- ඇණ

**උපකරණ සැකැස්ම :-**

**I පියවර :**
- විවිධ වර්ණ ඝනකම් කඩදාසිවලින් පහත දැක්වෙන අන්දමේ හැඩ කපා වෙන් කරගන්න.
- එම හැඩ පෙතිවල පුළුල් කෙළවරෙහි 0 සිට 9 තෙක් ඉලක්කම් නිවැරදිව ලියා ගන්න.
- මෙම පෙති ලැමිනේට් කරගන්න.

**II පියවර :**
- පෙතිවල පටු කෙළවරවල් එක මත එක අතිපිහිත වන අයුරින් තබා අමුණාගෙන අවානක් අයුරින් සකසා ගන්න. (එසේ අමුණාගත යුතු වන්නේ අවානෙහි පෙති එකිනෙකට සාපේක්ෂව චලනය කළ හැකි අයුරිනි. කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා මෙවැනි අවාන් කිහිපයක් සකස් කළ යුතු වේ.)








**ක්‍රියාකාරකම :-**

- යම් සංඛ්‍යාවක එක් එක් ස්ථානයට ලැබිය යුතු ඉලක්කම් පැවසූ පසු අදාළ සංඛ්‍යාව ඉලක්කම් අවානේ පෙති මගින් නිරූපණය කිරීමට සිසුන්ට පවරන්න.

**උදා. :-** එකස්ථානයේ දෙක, දහයස්ථානයේ තුන, සියයස්ථානයේ බිංදුව හා දහස්ථානයේ අටවන සංඛ්‍යාව සාදා පෙන්වන්න. එහි සංඛ්‍යා නාමය පැවසීමට පවරන්න. එම සංඛ්‍යාවේ ඉලක්කම්වල පිහිටීම මාරු කරමින් සෑදෙන සංඛ්‍යාත්, එක් එක් ඉලක්කම පිහිටි ස්ථානයත්, දැක්වෙන අගයත් පැවසීමට යොමු කරන්න.




## විකාශන අවස්ථා 01

**ක්‍රියාකාරකම :-** යම් ඉලක්කම් හතරක් ප්‍රකාශ කොට ඒවායින් සෑදිය හැකි සංඛ්‍යා කිහිපයක් ඉලක්කම් අවාන් මගින් නිරූපණය කිරීමට සිසුන්ට පවරන්න. එමගින් විශාල ම සංඛ්‍යාව සෙවීමට හා කුඩා ම සංඛ්‍යාව සෙවීමට සිසුන් යොමු කරවන්න.

5 4 1 8

ඉලක්කම් අවාන මගින් විශාල ම සංඛ්‍යාවක් සාදා ගැනීම පිණිස අගයෙන් වැඩි ම ඉලක්කම මුලටත්, ඊළඟට අගයෙන් වැඩි ඉලක්කම දෙවනුවටත්, ඉතුරු ඉලක්කම් දෙකෙන් අගයෙන් වැඩි ඉලක්කම තුන්වෙනුව සහ අවසානයේ අගයෙන් අඩු ම ඉලක්කම ලිවීමෙන් විශාල ම සංඛ්‍යාව ඉලක්කම් අවාන් පෙති මගින් නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.




**විකාශන අවස්ථා 02**

**ක්‍රියාකාරකම** :- යම් කණ්ඩායමක් තම ඉලක්කම් අවානේ පෙති මගින් යම් සංඛ්‍යාවක් නිරූපණය කර පෙන්වූ පසු තවත් කණ්ඩායම් දෙකකට ඊට පෙර හා පසු සංඛ්‍යා තම ඉලක්කම් අවාන්වල පෙති මගින් නිරූපණය කර දැක්වීමට පවරන්න.



# කියවන්නාගේ නාට්‍යාගාරය





# කියවන්නාගේ නාට්‍යාගාරය

**නිපුණතා** :-
- අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන්දෙයි.
- අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිතව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.
- සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ලී / යකඩ
- ඇණ
- තිර රෙදි

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- පහත රූපයේ දැක්වෙන ආකාරයට 2" × 2" ප්‍රමාණයේ ලී හෝ යකඩ වලින් 120cmක් දිග හා 90cm පළල වන සේ රාමුවක් සකස් කරගන්න.
- මෙම රාමුව පොළොව මට්ටමේ සිට 100cm - 150cm අතර උසකින් යුක්තව රඳවා තැබිය හැකි ආකාරයේ ආධාරකයකට සවි කරගන්න.
- සකස් කළ සැකිල්ල සුදුසු පරිදි තිර රෙදි යොදමින් කුඩා රඟහලක් ලෙස සකස් කරගන්න.



**ක්‍රියාකාරකම** :- ● පළමුවන, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල පෙළපොත් හා නිර්දේශිත අතිරේක කියවීම් පොත්වලින් නාට්‍යමය අවස්ථා සුලබ කොටස් තෝරා ගන්න.

● ඒවා රඟ දැක්වීමට උචිත වන ආකාරයට කුඩා දෙබස් ලෙස සංස්කරණය කර ගන්න.

● එදිනෙදා වටපිටාවෙන් සපයාගත හැකි දෑ භාවිත කරමින් ඔවුන් වෙස් ගන්වන්න.

● නිර්මාණය කරගත් කුඩා දෙබස් සහිත තිර පිටපත් අදාළ චරිතවලට ලබා දී ඔවුන් ඊට යොමු කරවන්න.

● එම චරිතවලට තනාගත් රඟහලෙහි නිරූපණ ඉදිරිපත් කිරීමට පවරන්න.

● භූමිකා රංගනයට ඉදිරිපත් නොවන සිසුන් වෙස් ගන්වන්නන්, පසුබිම් කථකයින් හා පසුබිම් ශබ්ද නිපදවන්නන් ලෙස යොදවා ගන්න.

**නිදසුන්** :- දිනක් කිරි හාමි කජු පුහුලම් කෑමට යාළුවන් සමඟ ගඟ ළඟ කජු ගහට ගියේ ය. ගඟට නැමුණු අත්තක අග ලොකු පුහුලමක් දැක, කිරි හාමිට එය ම කන්නට ආශාවෙක් විය.

"යන්නට එපා. යන්නට එපා. අත්තත් කඩාගෙන වැටෙයි." යහළුවෝ කීහ. කිරි හාමි ඒ නොඅසා අතු අගට ම ගියේ ය. 'ජරාස්' යන අනුකරණයෙන් අත්ත කැඩී කිරි හාමිත් සමග ගඟට වැටුණේ ය. කිරි හාමි හොඳට ම තෙමුණු නමුත්, යන්තම් පණ බේරා ගෙන ගොඩට ආයේ ය.

කිරි හාමි වහා හිසත්, පයත් අත ගා බැලී ය. දෙපළ ම එක සේ සීතල ය.
"මා මළා, මා මළා" යි හඬ නගමින් හේ බිම පෙරළුණේ ය.

**තිර පිටපත**

(ගඟට නැමුණු අතු සහිත කජු පුහුලන් පිරුණු විශාල කජු ගසකි. ඒ අසල කජු කැඩීමට සූදානමින් සිටින කිහිප දෙනෙකි.)

කිරි හාමි :- කවුද දැන් ගහට නඟින්නෙ?

1 මිතුරා :- මොකට ද ගහට නඟින්නෙ? මේ අත ගාව කජු පුහුලන් තියෙන්නෙ.

2 මිතුරා :- කිරි හාමිට ඕන ගහට නගින්නම ද?

කිරි හාමි :- (ගඟට නැමුණු අත්තක ඇති කජු පුහුලමක් දෙසට අත දිගු කර)
ආ...න්න අර කජු පුහුලම මට කඩා ගන්න ඕනෑ.

1 මිතුරා :- ඒක හරි අවදානම් වැඩක් නොවැ. මෙච්චර කජු තියෙද්දි ඒ කජු
පුහුලම ම කඩන්න ඕනෑ මොක ද?

කිරි හාමි :- (හිතුවක්කාර ලෙස) නෑ... මට ඕනෑ ඒක ම යි.

2 මිතුරා :- එහෙනම් කැමති දෙයක් කරගන්න.
(කිරි හාමි වහ වහා කජු ගසට නඟියි. නැඟ අත්තේ අගට ම බඩගායි.)

කිරි හාමි :- හරි... හරි... තව පොඩ්ඩයි.
(එසැනින් අත්ත කඩා ගෙන කිරි හාමි ගඟට වැටෙයි.)

මිතුරන් තිදෙනා ම :-
(එකවර... උස් හඬින්)
අයියෝ... කිරි හාමි ගඟට වැටුණෝ...
(කිරි හාමි ඉතා අපහසුවෙන් පණ බේරාගෙන ගොඩට පීනා එයි. මිතුරෝ කිරි හාමි වට කර ගනිති.)

1 මිතුරා :- කිරි හාමිට අමාරු ද?

කිරි හාමි :- (හදිස්සියේ මතක් වුවාක් මෙන් හිසත්, පයත් අතගා බලා)
අයියෝ... මා මළා... මා මළා...
(මිතුරෝ පුදුමයෙන් බලා සිටිය දී හිඳ ගෙන සිටි කිරි හාමි නැවත බිම දිගා වෙයි.)



ඈ දිවුවා... දිවුවා... බල්ලා අල්ලා ගන්න බැරි වුණා. ඈ අතරමං වුණා. ශේන්‍යා බය වෙලා අඬන්න ලැහැස්ති වුණා. එක පාරට ම කොහෙන්දෝ ආච්චි කෙනෙක් ආවා.
"ළමයො, ළමයො, මොකද උඹ අඬන්නේ?"
ශේන්‍යා ආච්චිට ඔක්කොම කීවා. ආච්චිට ශේන්‍යා ගැන දුක හිතුණා. ආච්චි ශේන්‍යා තමන්ගෙ මල් වත්තට එක්කරගෙන ගිහිල්ලා මෙහෙම කීවා.
"කමක් නෑ, අඬන්න එපා. මම උඹට පිහිට වෙන්නම්. මගේ මල් වත්තේ මලක් පිපිලා තියෙනවා. ඒ මලට කියන්නෙ 'හත් පෙති මල' කියලා. ඒ මලට ඔක්කොම කරන්න පුළුවන්. උඹ පාරේ යනකොට වටපිට බැලුවා වුණත් හොඳ ළමයෙක් බව මම දන්නවා. මම උඹට ඒ හත් පෙති මල තෑගි කරන්නම්. ඒක ඔක්කොම කර දෙනවා."
ඉතින් මෙහෙම කියලා ආච්චි මල් පාත්තියකින් ලස්සන මලක් කඩලා ශේන්‍යාට දුන්නා.

### තිර පිටපත

(මාර්ගය දිගේ යමක් සොයමින් දිව යන ගැහැනු ළමයෙකි. ඇයගේ මුහුණෙන් දැඩි වෙහෙසකාරී බවක් දිස්වේ.)

ශේන්‍යා :- (එක තැන නතර වී) අනේ මට පාර වැරදිලා වගේ. කොහොම ද මම දැන් ගෙදර යන්න පාර හොයා ගන්නෙ?
(ශේන්‍යා පාර අයිනේ වාඩි වී හඬන්නට පටන් ගත්තා ය. එක් වර ම එතැනට ආච්චි කෙනෙක් පැමිණෙ යි.)

ආච්චි :- (ඉතා කරුණාවෙන්) ළමයො... ළමයො... මොකද උඹ අඬන්නෙ?
(ශේන්‍යා හැඬීම නතර කර තමා අසල සිටින මහලු කාන්තාව දෙස බලයි.)

ශේන්‍යා :- (ඉතා පහත් හඬින්, ශෝකී ස්වරයෙන්)
මං පාන් වළලු ගේන්න කඩේට ආවා. මං පාන් වළලු අරගෙන ආපහු යද්දි මගේ අතේ තිබුණු පාන් වළලු ඔක්කොම බල්ලෙක් හොරකම් කර ගත්තා. මං ඌ පස්සෙ දුවගෙන එද්දි මට පාර වැරදුණා ආච්චියේ...

ආච්චි :- (කණගාටුවෙන්) ඔය ළමයට වෙලා තියෙන්නෙ ලොකු කරදරයක් නොවැ.
මං ඔය ළමයට උදව් කරන්නම්.

ශේන්‍යා :- ආච්චි, මට පාන් වළලු නැතුව ගෙදර යන්න බෑ.

ආච්චි :- හොඳයි. ඔය ළමයා මාත් එක්ක මගේ මල් වත්තට යන්න එනවද?
මං පාන් වළලු අරගෙන දෙන්නම්.

ශේන්‍යා :- (නොඉවසිල්ලෙන්) යමු... යමු...
(දෙදෙනා ම මල් වත්තක් මැදට ගොස් නතර වෙති. ආච්චි මල් වත්තේ ඇති එක මලක් කඩා ගනී.)

ආච්චි :- (ශේන්‍යා දෙසට මල දිගු කරමින්) මේ මලට කියන්නෙ හත් පෙති මල කියලා.
ඔබ හොඳ ළමයෙක් බව පේනවා. ඒ නිසා මං මේ මල ඔබට තෑගි කරනවා.
මේ මලෙන් ඔබට කැමති ඕනෑ ම දෙයක් ලබා ගන්න පුළුවන්.

ශේන්‍යා :- (ප්‍රීතියෙන්) ආච්චිට ගොඩක් ස්තූතියි.
(ශේන්‍යා මල් වත්තෙන් නික්ම යයි. ආච්චි බලා සිටී.)

මග හරහා විශාල දිය පාරක් ගලා යමින් තිබිණි. හාවා එක පිම්මට දිය පාරෙන් එහා පැත්තට පැන්නේ ය. ඉත්තෑවා තවමත් අනෙක් පැත්තේ සිටිනු දුටු හාවා තරහෙන් කෑගැසුවේ ය.
"ඕයි ඉත්තෑරාල, ඔය පොල්ල ඉක්මනට විසි කරන්න. ඔය පොල්ලත් එක්ක නම් පනින්න බෑ."
ඉත්තෑවා නිශ්ශබ්දව සිටියේ ය. ඌ ටික දුරක් පස්සෙන් පස්සට ගොස් දුවගෙන විත් පොල්ල දිය පාර මැද්දට ගසා එක පිම්මෙන් එහා පැත්තට පැන්නේ ය.
කිසි අමුත්තක් නැති ව මෙන් ඉත්තෑවා හාවා ළඟ සිට ගත්තේ ය. හාවා ඉත්තෑවා දෙස පුදුමයෙන් බැලී ය.
"ඔයාට අගේට පනින්න පුළුවන් නොවැ ඉත්තෑරාල."
"මම පනින්න දන්නෙ නැහැ. මම පනින කොට මේ පොල්ලෙ බලේ මට පිහිට වුණා."
දෙදෙනා කතා කරමින් ඉදිරියට ම ගිය හ.

**තිර පිටපත**

(කැලෑවක් හරහා වැටී ඇති මාර්ගයකි. කුඩා දිය පහරක් මාර්ගය හරස් කරමින් ගලා බසියි. දිය පහර අසල ඉත්තෑවෙක් සහ හාවෙක් එතෙර වීමට බලා සිටිති.)

හාවා :- ඔන්න මං පනිනවා. එකා... යි. දෙකා...යි. තුනා...යි.
(හාවා දිය පාරෙන් අනෙක් පැත්තට පැන ගනී.)

ඉත්තෑවා :- (පුදුමයෙන්) ෂා... හා හාමි හරි දක්ෂ යි නොවැ. කොහොමත් ඔයා පිනුම් අප්පු නෙ.

හාවා :- (උස් හඬින්) ඒක තමයි. ඉතින් ඉත්තෑරාල ඔය පොල්ල ඉක්මනට විසි කරන්න.
ඔය පොල්ලත් එක්ක කොහොම ද පනින්නෙ?
(මඳක් නිශ්ශබ්ද ව සිට නැවතත්.)
(නොඉවසිල්ලෙන්) මං පැනපු විදියට වීරිය අරන් පනින්න ඉත්තෑරාල.

ඉත්තෑවා :- ඔන්න මං පැන්නා එහෙනං...
(ඉත්තෑවා තම අතෙහි තිබූ පොල්ල දිය පාර මැදට ගසා එක පිම්මට අනෙක් පසට පනියි.)

හාවා :- (පුදුමයෙන්) ඔයාටත් අගේට පනින්න පුළුවන් නොවැ ඉත්තෑරාල...

ඉත්තෑවා :- (සිනාසෙමින්) මම පනින්න දන්නෙ නැහැ. ඒත් මම පනිද්දි
මේ පොල්ලෙ බලේ මට පිහිට වුණා නොවැ...
(දෙදෙනා ම නැවත මාර්ගය දිගේ ගමන් අරඹති.)

# පලඳනා කට්ටලය






# පලඳනා කට්ටලය

**නිපුණතා** :- 
- භාවිතයේ ඇති කාසි හා නෝට්ටු හඳුනාගනියි.
- එක් කාසියක් පමණක් වරකට භාවිත කර සරල ගනුදෙනු කරයි.
- යම් වටිනාකමක් විවිධ කාසි සංයෝජනවලින් ලබාදෙයි.

**ස්වරූපය** :- තේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :- 
- ඝනකම් කාඩ්බෝඩ්
- කාසිවල ඩිජිටල් අනුරූ
- මැලියම්
- රබර් ගෙළ පලඳනා පටි
- ඇණ

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- සියලු ම කාසිවල ඩිජිටල් අනුරූ නිර්මාණය කර ඒවා ප්ලාස්ටික් හෝ කාඩ්බෝඩ් වැනි සැහැල්ලු වෘත්තාකාර රවුම්වල අලවා ගන්න.
- පහත එක් එක් කාසි සඳහා දක්වා ඇති පරිමාණයන්ගෙන් යුත් විෂ්කම්භය සහිත කඩදාසි වෘත්ත සහ ඊට අදාළ කාසි ඩිජිටල් අනුරූ සකස් කරගන්න.

| | | | |
|---|---|---|---|
| ශත 25 | - 18 cm | රු. 2 | - 27 cm |
| ශත 50 | - 21 cm | රු. 5 | - 24 cm |
| රු. 1 | - 24 cm | රු 10 | - 24 cm |



- එක් එක් රවුම් ගෙලෙහි පලඳවාලිය හැකි අන්දමේ ඉලාස්ටික් පටි යෙදූ ගෙළ පලඳනා ලෙස සකස් කර ගැනීම. (එක් කාසි වර්ගයකට එක් වර්ණයකින් යුත් පටි බැගින් වන පරිදි)



**ක්‍රියාකාරකම :-**

- පන්තියේ සියලු ම සිසුන්ට හෝ තෝරා ගත් කණ්ඩායමකට කාසි මාල පැලඳ ගැනීමට ලබා දී පැලඳගත් මාලයෙහි සඳහන් කාසියෙහි ලක්ෂණ විස්තර කිරීමට පවරන්න.




**විකාශන අවස්ථා 01**

**නිපුණතාව :-** මුදල් භාවිතය හා ගනුදෙනු ආශ්‍රිත ගැටලු විසඳයි.




**ක්‍රියාකාරකම :-**

- සමාන කාසි පැලඳගත් සිසුන් වෙන වෙන ම කණ්ඩායම් ලෙස ගොනුවීමට යොමු කරන්න.
- ගුරුතුමිය පැලඳගත් කාසි මාලයෙහි සඳහන් කාසියෙහි වටිනාකමට අදාළ අගය දැක්වෙන කාසි සංයුතිය ලැබෙන අයුරින් කාසි මාල සහිත සිසුන්ට කණ්ඩායම් වීමට අවස්ථාව දෙන්න

- ගුරුතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන භාණ්ඩයේ වටිනාකම දැක්වෙන කාසි සංයුතිය ලැබෙන අයුරින් කාසි මාල සහිත සිසුන්ට වෙන වෙන ම කණ්ඩායම් වීමට අවස්ථාව දෙන්න.




**විකාශන අවස්ථා 02**

**නිපුණතාව** :- රුපියල් 20 තෙක් මුදල් නෝට්ටු සහ කාසි හඳුනාගෙන ගනුදෙනු කරයි.

**ක්‍රියාකාරකම** :-

- එළවළු හා පලතුරු මුහුණු පැලඳගත් හා මිල පුවරු ගෙලෙහි එල්ලා ගත් සිසුන් පිරිසක් සෙල්ලම් කඩයෙහි රඳවා එහි මුදලාලි කෙනෙකු පත් කරන්න.
- මුදලාලිට කාසි මාල පැලඳගත් සිසුන් කිහිප දෙනෙකු තබා ගැනීමට පවරන්න.
- සෙල්ලම් කඩයේ බඩු මිලට ගැනීමට කාසි මාල සහිත සිසුන් කැටුව එන පාරිභෝගිකයින් (සිසුන්) භාණ්ඩයේ වටිනාකමට සමාන කාසි ලබා දෙමින් අදාළ එළවළු හා පලතුරු මුහුණු සහිත සිසුන් මිලට ගැනීමට යොමු කරන්න.
- එසේ ම යම් මුදලක් ඉතිරි වන්නේ නම් එම මුදල මුදලාලි සතුව ඇති කාසි මාල පැලඳි සිසුන්ගෙන් පාරිභෝගිකයාට ගෙවීමට මුදලාලිට පවරන්න.







### විකාශන අවස්ථා 03

**නිපුණතාව** :- මුදල් භාවිතයෙන් ගනුදෙනු කරයි.




**ක්‍රියාකාරකම** :-

- ඉහත දැක්වූ ආකාරයට ම කාසි අනුරූ සහිත කරපටි වෙනුවට නෝට්ටු අනුරූ සහිත කරපටි සකස් කරගන්න.

- බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය මගින් අදාළ නෝට්ටු තිරය මත ප්‍රදර්ශනය කරන්න.
- නෝට්ටු අනුරූ සහිත කරපටි සිසුන්ට පැළඳ ගැනීමට සලස්වන්න.
- තිරය මත ප්‍රදර්ශනය කරනු ලබන නෝට්ටුවල ලක්ෂණ විස්තර කරමින් ඒවා තමා පැලඳි නෝට්ටු අනුරූවල ඇත්දැයි විමසීමට සිසුන් යොමු කරවන්න.
- තමා පැලඳි නෝට්ටුවල ලක්ෂණ විස්තර කිරීමට සිසුන්ට පවරන්න.




- එක් එක් නෝට්ටුවල අගයන්ට සමාන වටිනාකම නෝට්ටු සහ කාසි සංයුතියන් ඇසුරෙන් සිසු කණ්ඩායම් ලෙස ගොනු වී නිරූපණය කිරීමට අවස්ථා සලස්වන්න.



## විකාශන අවස්ථා 04

**නිපුණතා** :-
- කිලෝ ග්‍රෑමය හා ග්‍රෑමය භාවිත කරමින් බර මනියි.
- කිලෝ ග්‍රෑමය හා ග්‍රෑමය අතර සම්බන්ධතාව ප්‍රායෝගික අවස්ථා සඳහා භාවිත කරයි.
- කිලෝ ග්‍රෑම්වලින් බර නිමානය කරයි. ගැටලු විසඳයි.

**උපකරණ සැකැස්ම** :-

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.




- කාඩ්බෝඩ් වැනි සැහැල්ලු වෘත්තාකාර රවුම්වල ඉහත ආකාරයේ බර ප්‍රමාණ සටහන් කරගන්න.
- එක් එක් රවුම් ගෙළෙහි පලඳවාලිය හැකි අන්දමේ ගෙළ පලඳනා ලෙස සකස් කරගන්න.
(එක් බරක් සටහන් කළ රවුමකට එක් වර්ණයකින් යුත් පටි බැගින් වන පරිදි)

**ක්‍රියාකාරකම I** :-



**ක්‍රියාකාරකම II :-**




**විකාශන අවස්ථා 05**

**නිපුණතා :-**

- දිග මැනීමේ මිනුමක් ලෙස සෙන්ටිමීටරය භාවිත කරයි.
- මීටර හා සෙන්ටිමීටර අතර සම්බන්ධතාවය හඳුනාගෙන ප්‍රායෝගික අවස්ථා සඳහා යොදා ගනියි.
- සම්මත ඒකක භාවිත කර දිග මනියි.
- මීටර හෝ සෙන්ටිමීටරවලින් දිග නිමානය කරයි. ගැටලු විසඳයි.

**උපකරණ සැකැස්ම :-**




- කාඩ්බෝඩ් වැනි සැහැල්ලු වෘත්තාකාර රවුම්වල ඉහත ආකාරයේ දිග පිළිබඳ අගයන් සටහන් කරගන්න.

- එක් එක් රවුම් ගෙළෙහි පලඳවාලිය හැකි අන්දමේ ගෙළ පලඳනා ලෙස සකස් කරගන්න. (එක් දිග අගයක් සටහන් කළ රවුමකට එක් වර්ණයකින් යුත් පටි බැගින් වන පරිදි)

**ක්‍රියාකාරකම :-**




## විකාශන අවස්ථා 06

**නිපුණතා :-**

- ලීටර හා මිලිලීටර ඇසුරින් පරිමාව හා ධාරිතාව මනියි.
- ලීටර හා මිලිලීටර ප්‍රමාණ ආශ්‍රිත ගැටලු විසඳයි.
- ලීටර හෝ මිලිලීටරවලින් දෙනු ලබන ද්‍රව ප්‍රමාණ ආශ්‍රිත ගැටලු විසඳයි.

**උපකරණ සැකැස්ම :-** කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.




- කාඩ්බෝඩ් වැනි සැහැල්ලු වෘත්තාකාර රවුම්වල ඉහත ආකාරයේ ද්‍රව පරිමා සටහන් කරගන්න.
- එක් එක් රවුම් ගෙළෙහි පලඳවාලිය හැකි අන්දමේ ගෙළ පලඳනා ලෙස සකස් කරගන්න. (එක් පරිමාවක් සටහන් කළ රවුමකට එක් වර්ණයකින් යුත් පටි බැගින් වන පරිදි)

**ක්‍රියාකාරකම :-**







## විකාශන අවස්ථා 07

**නිපුණතා :-**

- I සිට X තෙක් රෝම සංඛ්‍යාංක කියවයි. ලියයි.
- XX තෙක් රෝම සංඛ්‍යා ලියයි.

**උපකරණ සැකැස්ම :-** කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.






- කාඩ්බෝඩ් වැනි සැහැල්ලු වෘත්තාකාර රවුම්වල ඉහත ආකාරයට 1 - 20 තෙක් අරාබි ඉලක්කම් සටහන් කරගන්න.

- එසේ ම තවත් රවුම්වල ඒ ආකාරයට ම 1 - 20 තෙක් රෝම ඉලක්කම් සටහන් කරගන්න.

**ක්‍රියාකාරකම :-**






# සිරිමත් ගැළපුම





තම දෙවියන් නැමද
මව්පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස් වැඳ
අකුරු නිසි ලෙස ඉගෙන ගනු සොඳ
දෙවියන්
මව්පියන්
ගුරුන්
හොඳින්

# සිරිමත් ගැළපුම

**නිපුණතා** :- ● තමන්ගේ හා අනෙක් අයගේ යහ පැවැත්මට අදාළ පුරුදු අනුගමනය කරයි.
● යහපැවැත්මෙහි අගය අවධාරණය කෙරෙන කවි, ගී ගායනා හා රංගනවල නිරත වෙයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
● බහුප්‍රක්ෂේපණ යන්ත්‍රයක්
● කාඩ්බෝඩ්
● මාකර් පෑන්
● කතුර

**උපකරණ සැකැස්ම :-**



**ක්‍රියාකාරකම :-**

**I පියවර :**

- සිරිමත්ගේ කවි පෙළෙන්, සිරිත් මල්දමෙන් හා බාලෝපදේශයෙන් උපුටා ගත් කවිවලට අදාළ වීඩියෝ සකස් කරගන්න. (එය බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය මගින් තිරය මත ප්‍රක්ෂේපණය කිරීමට හැකි විය යුතුයි.)

**II පියවර :**

- යහපැවැත්මෙහි අගය අවධාරණය කෙරෙන කවි ගායනා කරමින් රංගනයක යෙදීමට සිසුන් යොමු කරවන්න. එම යහ පුරුදු ඉස්මතු වන සේ සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

**III පියවර :**

- එක් එක් කවිපෙළෙන් සාදා ගත හැකි හොඳ සිරිත් වචන කිහිපයකින් යුත් සරල වගන්ති ලෙස කාඩ්පත් මත ලියා ගන්න. ඒවා වචන වෙන් වන සේ කුඩා කාඩ්පත්වලට කපා වෙන් කරගන්න.

උදා :- කුණු සරුප නොකියමු
කේලම් වචන නොකියනු
විහිලු බොරු නොකියනු
ඇනුම් පද කිසිවෙකුට නොකියනු

| කැත | වචන | නොකියමු. |
|---|---|---|
| කේලම් | නොකියමු. | |
| විහිළු බොරු | නොකියමු. | |
| ඇනුම් පද | නොකියමු. | |

පාරෙ යන එන විට
අයින් වීමෙන් දකුණට
දුව පැන දඟ නොකොට
ගමන් කළ යුතුය කී හැම විට

| පාරේ | දකුණෙන් | ගමන් කරමු. |
|---|---|---|
| පාරේ | දඟ | නොකරමු. |

අඟුරු හුණු කැට ගෙන
විහිළු නොලියනු තැන
බිත්ති කණු කිසි තැන
යමක් නොලියනු අයුතු විලසින

| බිත්තිවල | කුරුටුබලි | නොඅඳිමු. |
|---|---|---|
| බිත්තිවල | නම් | නොලියමු. |

**IV පියවර :**

- කවි කිහිපයකට අදාළ ව සැකසූ එවැනි වචන කාඩ්පත් කලවම් කර සිසු කණ්ඩායම්වලට සපයන්න.

**V පියවර :**

- යම් නිශ්චිත කාලසීමාවක් තුළ කවිය ප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිත කර තිරය මත දෘශ්‍යමාන කරවන්න.

**VI පියවර :**

- තිරය මතින් කවිය ඉවත්වීමට පෙර එකී කවියෙන් කියැවෙන හොඳ සිරිත්, වචන කාඩ්පත් ඇසුරෙන් නිර්මාණය කර පෙන්වීමට සිසුන්ට පවරන්න.

**VII පියවර :**

- කාඩ්පත් නිවැරදිව පිළිවෙළට ඉක්මනින් ම තබමින් වගන්තිය නිර්මාණය කළ කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වනු ඇත.

සිරිත් මල්දම හා බාලෝපදේශය කවි පොත්වලින් උපුටා ගන්නා ලද පහත කවි යොදා ගනිමින් සිරිත් විරිත්වලට අදාළ පුවරු සකස් කර ගන්න.

කෑම කමින් චව් චව් යන
සද්ද නගා නොවිකනු මැන
කැඳ ආදිය බොන කල දැන
නොකරනු හඬ සුරු සුරු යන

ඉඳුල් අතින් පැන් බඳුන ද
නාල්ලනු ච හැඳි ආදි ද
කටේ කෑම පුරවා ඉඳ
නොදොඩන් කිසි විටෙක සබඳ

ඇඟිලි ද තොල් ලෙව නොකනු
දිව පිටතට නොම අදිනු
පිළිකුල් උපදින කරුණු
කිසිවක් සකි නොම කරනු

මාළු කටු ද කසළ වෙනත්
මේසය උඩ නොදමනු යුත්
ඒ ගැන බඳුනක් නැතහොත්
බිම දමනුද වේ යහපත්

තම සමගින් කන පිරිසට
පිළිකුල් නූපදින ලෙසට
කලබල නොව යස විලසට
කෑම කනුව වී සහතුට

ගෙදොර අතුගෑමෙන
මූණ කට සෝදාගෙන
ඔළුව පීරා ගෙන
අකුරු පාඩම් කරනු සතුටින

කිලිටු රෙදි බැනියම්
ඇඳුම් නාදිනු කිසියම්
පිරිසිදු නිසි ඇඳුම්
අඳින් හැම කළ නුඹට ඇත්නම්

හිස අවුල් කරගෙන
කිලුටු වැරහැලි ඇඳගෙන
පඹයෙකුගෙ විලසින
ඉඳුම හොඳ නෑ බූත කරමින

තම දෙවියන් නැමද
මව්පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස් වැඳ
අකුරු නිසි ලෙස ඉගෙන ගනු සොඳ

ගල්ලෑලි පොත්වල
විහිළු නොලියනු කිසිකල
පිරිසිදුව හැම කල
තබනු පොත්පත් සියලු දේපල

පාසලෙහි තැන තැන
කෙළ නොගසන් නොහොබී දැන
සෙම් සොටු සූරමින
මිදුලෙහි ද නොදමන් කිසි තැන

කෑමට අත දමමින් නොමගන්නේ
කන විට කැත ලෙස තලු නොගසන්නේ
කිසිවිට අඬමින් කෑම නොගන්නේ
හැම විට සතුටින් ඉඳ කාපන්නේ

හිසකේ හැපීම ද
ඉන්න තැන කෙළ ගැසුම ද
නියපොතු විකීම ද
අසුබ ලකුණු ය සිතන් හැම සඳ

# ස්ථානීය අගය පෙත



ස්ථානීය අගය පෙත
9000 900 90 9
8000 800 80 8
7000 700 70 7
6000 600 60 6
5000 500 50 5
4000 400 40 4
3000 300 30 3
2000 200 20 2
1000 100 10 1




ස්ථානීය අගය පෙත

# ස්ථානීය අගය පෙත

**නිපුණතා** :- 
- ඉලක්කම් හතරකට නොවැඩි සංඛ්‍යාවක් කියවයි. ලියයි.
- එහි එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය ප්‍රකාශ කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :- 
- වයිට් බෝඩ්
- ලී
- ඇණ
- චූෂක රැඳවුම්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**
- 130cm x 100cm දිගින් හා පළලින් යුත් සෘජුකෝණාස්‍රාකාර වයිට් බෝඩ් එකක් සකසා ගන්න.



**2 පියවර :**
- එහි සුමට පෘෂ්ඨයේ පහත දැක්වෙන ආකාරයේ ස්ථානීය අගය පෙතක් ඇඳගන්න.

**ස්ථානීය අගය පෙත**

| | | | |
|---|---|---|---|
| 9000 | 900 | 90 | 9 |
| 8000 | 800 | 80 | 8 |
| 7000 | 700 | 70 | 7 |
| 6000 | 600 | 60 | 6 |
| 5000 | 500 | 50 | 5 |
| 4000 | 400 | 40 | 4 |
| 3000 | 300 | 30 | 3 |
| 2000 | 200 | 20 | 2 |
| 1000 | 100 | 10 | 1 |

**2 පියවර :**

- යම් පෘෂ්ඨයක යමක් අලවා තැබීමට යොදා ගන්නා චූෂක ආධාරක විවිධ වර්ණවලින් සපයා ගන්න.



**ක්‍රියාකාරකම :-**

- සිසුන්ට සංයුක්ත අත්දැකීම් ලබා දීමෙන් පසු මෙම ක්‍රියාකාරකම්වල යොදවන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- එක් කණ්ඩායමක් ඉලක්කම් හතරේ යම් සංඛ්‍යාවක් පවසන අතර අනෙක් කණ්ඩායමට එකී සංඛ්‍යාව ස්ථානීය අගය පෙත මත චූෂක යොදා ගනිමින් සලකුණු කිරීමට පවරන්න.
- නිවැරදිව හා ඉක්මනින් අදාළ සංඛ්‍යා පෙත මත චූෂක මගින් සංඛ්‍යාව නිරූපණය කළ කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම ලෙස සලකන්න.




- විකාශන අවස්ථා සඳහා ස්ථානීය අගය පෙත භාවිත කරමින් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල දක්වා ඇති ක්‍රියාකාරකම් මෙන් ම ගුරුවරුන් විසින් නිර්මාණය කරනු ලබන ක්‍රියාකාරකම්වල ද සිසුන් නිරත කරවන්න.

# විස්කම් පැදුර





# විස්කම් පැදුර

**නිපුණතා** :- කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.
ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි.

**ස්වරූපය** :- තේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ෆ්ලෙක්ස් එලකයක්
- මාකර් පෑන්
- නූල්
- කාඩ්බෝඩ්
- සායම්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**
- 120cm x 120cm දිගින් හා පළලින් යුත් සමචතුරස්‍රාකාර කොටු 100කින් යුත් එලක (පැදුරු) 4ක් පමණ සකස් කරගන්න.
- මෙම එලකය (පැදුර) වටා දාරය පයිපින් කරගන්න.



**II පියවර :**

- සිංහල වර්ණ මාලාවට අයත් පිලි රහිත අක්ෂර නිවැරදි අංග හා ප්‍රමාණ සහිතව ලියූ විෂ්කම්භය 7cm ප්‍රමාණයේ කඩදාසි රවුම් කණ්ඩායම්වලට ප්‍රමාණවත් තරමින් සපයා ගන්න.




- එසේම 10cm x 10cm ප්‍රමාණයේ කළු පැහැයෙන් වර්ණ කරන ලද කාඩ්පත් ප්‍රමාණවත් තරමින් සපයා ගන්න.



**ක්‍රියාකාරකම :-**

- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න. ඔවුනට අකුරු සටහන් කළ වෘත්ත සහ කළු කාඩ්පත් ප්‍රමාණවත් තරමින් සපයන්න.
- කණ්ඩායම් දෙකකට එකවර පැදුර මත ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට සැපයූ අකුරු සටහන් කළ වෘත්ත හා කළු කාඩ්පත් යොදා ගනිමින් සපයා ඇති කාල සීමාව තුළ වැඩි ම අර්ථවත් වචන සංඛ්‍යාවක් පැදුර මත වූ කොටු පුවරුවේ නිර්මාණය කළ යුතු වේ.
- වචන වෙන් කිරීම පිණිස කළු කාඩ්පත් භාවිත කළ හැකිය. එසේ ම තරගය අතර තුළ දී කණ්ඩායම් දෙක අතර අකුරු සටහන් කළ වෘත්ත හුවමාරු කර ගැනීමට සීමිත අවස්ථා ගණනක් සපයා දිය හැකිය.
- නියමිත කාල සීමාව තුළ වැඩි ම අර්ථවත් වචන සංඛ්‍යාවක් කොටු පුවරුව මත නිර්මාණය කළ කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වේ.
- විවිධ නිපුණතා මට්ටම් සහිත සිසුන් සඳහා විවිධ මට්ටමෙන් ක්‍රියාකාරකම සැලසුම් කරන්න.
  (උදා :- අකුරු දෙකේ වචන, අකුරු තුනේ වචන)
- කණ්ඩායම් හතරක් ක්‍රියාකාරකමෙහි යොදවන්නේ නම් අකුරු කට්ටල වර්ග 4කින් සැකසීම කළ හැකි ය.


ක ඞ ල ස ර ම
ස ඹ
ය ය
ච
හ
ග හ ල
ර ට අ හ ස
ත

විකාශන අවස්ථා 01

**ක්‍රියාකාරකම :-** • පළමුවන ප්‍රධාන අවධියේ හඳුන්වාදෙනු ලබන සියලු ම පිලි යෙදුණු සිංහල වර්ණ මාලාවේ අක්ෂර ලියූ වෘත්ත හා කළු කාඩ්පත් සපයා ඉහත ආකාරයට ම වචන ගොඩනැගීමට සිසුන්ට පවරන්න.



## විකාශන අවස්ථා 02

**ක්‍රියාකාරකම :-** ● ගුරුවරයා විසින් රූපයක් ලබා දීම හා එහි ඇති වස්තූන්වලට අදාළ නම් /ක්‍රියාකාරකම් දැක්වෙන වගන්ති අකුරු සඳහන් වෘත්ත යොදමින් සම්පූර්ණ කිරීමට සිසුන්ට පවරන්න.





## විකාශන අවස්ථා 03

**ක්‍රියාකාරකම** :- ● ගුරුවරයා විසින් ප්‍රහේලිකා සකස් කිරීමට සිසුන් යොමු කරවන්න. ආරම්භයේ දී පහත දැක්වෙන ආකාරයේ ඉඟි වැකි සපයන්න. සිසුන් ලවා ම ප්‍රහේලිකා ගොඩනැංවීමට අවස්ථාව සලසන්න.

උදා : හරහට - කතා කරන සතෙකි
හරහට - නිදා ගැනීමට ගනියි.
පහළට - ගමන් බිමන් යාමට අවශ්‍ය වේ.
පහළට - අපට එළිය දෙන වස්තුවකි.



## විකාශන අවස්ථා 04

**ක්‍රියාකාරකම :-** ● සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න. එක් කණ්ඩායමක් (A) ප්‍රහේලිකා ගොඩනැංවීමට අදාළ ඉඟිවැකි සැපයිය යුතු අතර, අනෙක් කණ්ඩායම (B) ඊට අනුරූපීව පිළිතුරු වචන ප්‍රහේලිකා ලෙස ගොඩනැංවිය යුතු වේ.

උදා : A කණ්ඩායම - 1. එයාට වක් වූ හොටක් තිබෙනවා.
2. එයාගෙ බෙල්ලේ රතු පාට මාලයක් තිබෙනවා.
3. එයාට කතා කරන්නත් පුළුවනි.
4. එයාගෙ නමේ මැද අකුරෙන් රසවත් පලතුරක නමක් හැදෙනවා.



# හෝරා චක්‍රය






# හෝරා චක්‍රය

**නිපුණතා** :- ● ඔරලෝසු මුහුණතක දැක්වෙන වේලාව පැයවලින් හා පැය භාගවලින් කියවයි.
● කාලය හා කාලය ගතවීම පිළිබඳ අවබෝධය ගැටලු විසඳීම සඳහා භාවිත කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- MDF බෝඩ්
- කියත
- මිටිය
- ලී අලවන මැලියම්
- ඇණ

**උපකරණ සැකැස්ම :-**

**I පියවර :**

- 40cmක විෂ්කම්භයකින් යුත් වෘත්ත දෙකක් MDF බෝඩ්වලින් කපා වෙන් කර ගන්න.




**II පියවර :**

- එම එක් එක් වෘත්ත සමාන කොටස්වලට බෙදා හින්දු අරාබි ඉලක්කම් සහ රෝම ඉලක්කම් සහිත ඔරලෝසු මුහුණත් සේ සකසා ගන්න.



**III පියවර :**

- මිනිත්තු කටුව හා පැය කටුව ලී හෝ කම්බිවලින් සකසා ගන්න.
  (පැය කටුව 15cm දිගකින් යුතු මහත කොට කටුවක් ලෙස ද, මිනිත්තු කටුව 20cm දිගකින් යුතු සිහින් දිග කටුවක් ලෙස ද සැකසිය යුතු වේ.)




**IV පියවර :**

- චලනය කළ හැකි වන අයුරින් වෘත්තයේ කේන්ද්‍රයට කටු සවි කරගන්න.

- සිරස්ව සිටුවා තැබිය හැකි ආකාරයට පහත අන්දමින් ආධාරකයක් යොදා ගන්න.



**ගුරු උපදෙස් :-**

- මිනිත්තු කටුව චලනය කරවීමේ දී පැය කටුව ද ඊට සාපේක්ෂව චලනය වෙමින් ස්ථානීය පිහිටීම වෙනස් කර ගන්නා බව ආදර්ශනයේ දී අවධාරණය කරන්න.

**පැය 24 ඔරලෝසුව සකසා ගැනීම :-**

**I පියවර :**

- MDF හෝ තුනී බෝඩ්වලින් පහත දැක්වෙන ආකාරයේ ඝනකාභ හැඩැති පෙට්ටියක් සකසා ගන්න.
- එහි එක් මුහුණතක කවුළුවක් කපා ඉවත් කර ගන්න.



**II පියවර :**

- ඝනකාභ හැඩැති පෙට්ටියේ ඉහළ හා පහළ තලවල ෆ්ලෙක්ස් තීරුවක් රිංගවිය හැකි අයුරින් සමාන්තර තිරස් පටු කාණු දෙකක් සකසා ගන්න.




**III පියවර :**

- මෙම ඝනකාභය පහත දැක්වෙන අන්දමින් ඍජුව සිටුවා තැබිය හැකි ආකාරයේ ආධාරකයකට සවි කරගන්න.



**IV පියවර :**

- රූපයේ දැක්වෙන ආකාරයට කුඩා ඩබර ආකෘති දෙකක් සකසා ගන්න.



**V පියවර :**

- රූපයේ දැක්වෙන ආකාරයට කුඩා ඩබර ආකෘති දෙක පෙට්ටිය රඳවා ඇති ආධාරකයට සවි කරගන්න.



**VI පියවර :**

- ඩිජිටල් ඔරලෝසු මුහුණතක වේලාව නිරූපණය වන ආකාරයට පැය 24ක කාල සීමාවට අදාළ ව පැයෙන් පැයට වේලාව ෆ්ලෙක්ස් පටියක සටහන් කරගන්න.



VII පියවර :

- සංඛ්‍යාංක මුද්‍රිත ෆ්ලෙක්ස් පටිය ඝනකාභ හැඩැති පෙට්ටියේ ඉහළ හා පහළ පටු කාණු තුළින් රිංගවා ඩබර ආකෘතිවලට සවි කරගන්න.










**ක්‍රියාකාරකම :-**

- පැය 12 සහ පැය 24 ඔරලෝසු ඇටවුම් භාවිත කරමින් කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉසව් සංවිධානය කරන්න.

- එක් කණ්ඩායමක සිසුන් පැය 12 ඔරලෝසුවෙහි වේලාවක් නිරූපණය කළ විට අනෙක් සිසු කණ්ඩායමට එය පැය 24 ඔරලෝසුවෙන් නිරූපණය කිරීමේ අවස්ථා සැලසුම් කරන්න.

- මේ සඳහා ඔරලෝසු කටු චලනය කරවමින් හා ෆ්ලෙක්ස් පටිය අදිමින් ඩබරය මගින් පහළට රෝල් කරමින් පැය 12 ඔරලෝසු වේලාවන් හා පැය 24 ඔරලෝසු වේලාවන් සැසඳීමට සිසුන් යොමු කරන්න.

- තවද, පැය 12 ඔරලෝසුව භාවිතයෙන් රෝම ඉලක්කම් හා හින්දු අරාබි ඉලක්කම්වලින් නිරූපිත ඔරලෝසු වේලාවන් අතර සම්බන්ධතා හඳුනාගැනීමට සිසුන් යොමු කරවන්න.

# භ්‍රමණ රෝදය





# භ්‍රමණ රෝදය

**නිපුණතාව** :- සතියේ දවස්වල නම් නිවැරදිව භාවිත කරයි.

**ස්වරූපය** :- තේවල / යුගල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ෆෝමිකා බෝඩ්
- ප්ලැනල් රෙදි
- හාඩ්බෝඩ්
- වෙල්කෝ ටේප්
- ලී
- ඇණ
- සායම්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- විෂ්කම්භය 60cm ක් වූ වෘත්තයක් ෆෝමිකා බෝඩ් එකකින් කපා වෙන් කරගන්න.




**II පියවර :**

- විෂ්කම්භය 60cm ක් වූ වෘත්තයක් වෙල්කෝ / ප්ලැනල් රෙදිවලින් කපා වෙන් කර එය ෆෝමිකා වෘත්තය මත හොඳින් අලවා ගන්න.




**III පියවර :**

- විෂ්කම්භය 60cm ක් වූ තවත් වෘත්තයක් හාඩ් බෝඩ් එකකින් කපා වෙන් කර එහි එක් පෘෂ්ඨයක් සමාන කොටස් 7කට බෙදා සතියේ දින 7හි නම් වාමාවර්තව අනුපිළිවෙළින් ලියන්න. අනෙක් පෘෂ්ඨයෙහි වෙල්කෝ ටේප් අලවා ගන්න.



**IV පියවර :**

- ෆෝම්කා වෘත්තය කේන්ද්‍රය වටා භ්‍රමණය කළ හැකි අයුරින් රැඳවිය හැකි සේ ආධාරකයක් සකසා ගන්න. පාදම පුවරුව මත සවිකර ගත හැකි ප්‍රමාණයේ තරමින් යුත් ඝනකම් කාඩ්පත් 3ක් සකසා ඒවායේ ඊයේ, අද, හෙට යන වචන ලියා ගන්න.







**ක්‍රියාකාරකම :-**

- සතියේ දින 7 සටහන් වෘත්තය ඇටවුමේ රැඳවූ ෆෝම්කා වෘත්තය මත අලවා භ්‍රමණය කරවීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- වෘත්තයේ භ්‍රමණය නැවතුණු පසු "අද" ස්ථානය ඉදිරියෙන් තිබෙන දවස විමසා ප්‍රතිචාර ලබා ගන්න.
- "අද" දවසට සාපේක්ෂව "ඊයේ, හෙට, අනිද්දා" යෙදෙන දවස විමසා ප්‍රතිචාර ලබා ගන්න.
- මේ අනුව අද දවසට දින දෙකකට පෙර හා දින දෙකකට පසු දින ආදි වශයෙන් පිළිතුරු සිසුන්ගෙන් ලබා ගන්න.

## විකාශන අවස්ථා 01

**නිපුණතාව :-** මිනිත්තු, පැය, දවස්, සති හා මාස අතර සම්බන්ධතා හඳුනාගෙන භාවිත කරයි.

**උපකරණ සැකැස්ම :-**

මෙම ක්‍රියාකාරකම සඳහා පහත අදාළ නම් සඳහන් වෘත්තයක් භාවිත කළ යුතු අතර පාදම මත රඳවන පුවරු ද ඊට අනුරූපීව වෙනස් කර ගත යුතු ය.
කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.




**ක්‍රියාකාරකම :-**

- වෘත්තය කරකැවීමට සලස්වා එය නැවතුණු පසු ඊ හිස යොමුවී ඇති ස්ථානයට අනුව ඊට පෙර මාසය හා පසු මාසය දැක්වීමටත් එම එක් එක් මාසයට ඇති දින ගණන් පැවසීමටත් යොමු කරන්න.

- භ්‍රමණ රෝදය කරකැවීමට සිසුන්ට අවස්ථාව ලබා දී කරකැවුණු ප්‍රමාණය අනුව ගතවන කාලය ගණනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**උදා :-** පෙබරවාරි සිට එක් වටයක් කරකැවී පෙබරවාරි දක්වා පැමිණිය හොත් අවුරුද්දක් ගත වූ බව අවබෝධ කරන්න.
පෙබරවාරි සිට එක් වටයක් කරකැවී අප්‍රේල් දක්වා පැමිණිය හොත් අවුරුද්දකුත් මාස 2ක් ගත වූ බව අවබෝධ කරන්න.

## විකාශන අවස්ථා 02

**නිපුණතාව :-** ඉගෙනීම සංවර්ධනය සඳහා සවන්දෙයි.

**උපකරණ සැකැස්ම :-** විකාශන අවස්ථා 01 සඳහා යොදා ගත් සැකැස්ම භාවිත කරන්න.

**ක්‍රියාකාරකම :-** ඉහත රූපයේ දැක්වෙන පරිදි සකස් කර ගත් කාල චක්‍රය ක්‍රියාත්මක කරමින් ඒ ඒ මාසවලට අදාළ විශේෂිත දින නම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**උදා :-** ජුනි 05 ලෝක පරිසර දිනය, ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය
ජාතික හා ආගමික උත්සව පැවැත්වෙන මාස හා දින






**විෂය ක්ෂේත්‍රය :** පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## විකාශන අවස්ථා 03

**උපකරණ සැකැස්ම :-**

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** එක් එක් පළාතට අදාළ දිස්ත්‍රික්ක විමසීම සහ දිස්ත්‍රික්කවලට අදාළ පළාත් විමසීම.




## විකාශන අවස්ථා 04

**උපකරණ සැකැස්ම :-**

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** ශ්‍රී ලංකාවේ පිහිටි ඓතිහාසික සිද්ධස්ථාන, පිහිටි පළාත සහ දිස්ත්‍රික්ක විමසීම.



## විකාශන අවස්ථා 05

### උපකරණ සැකැස්ම :-

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** ගංගා සහ ගංගා මුහුදට වැටෙන ස්ථාන විමසීම.




## විකාශන අවස්ථා 06

### උපකරණ සැකැස්ම :-

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** ජාතික කොඩියේ, රාජ්‍ය ලාංඡනයේ සංකේත සහ ඉන් ප්‍රකාශිත අදහස් විමසීම.



## විකාශන අවස්ථා 07

### උපකරණ සැකැස්ම :-

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම** :- ජලය ද්‍රව්‍ය සමග මුසු කිරීමේ දී ක්‍රියා කරන ආකාර විමසීම. (ගල - ගිලෙයි, ශාක පත්‍රය - පාවෙයි, ලුණු - දියවෙයි)






## විකාශන අවස්ථා 08

### උපකරණ සැකැස්ම :-

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම** :- භ්‍රමණ රෝදය නැවතුණු තැන සඳහන් ජන කවිය (පැල් කවි, පාරු කවි, දරු නැළවිලි ගී, කරත්ත කවි, ගොයම් කවි, පතල් කවි) සිසුන් ලවා ගායනා කිරීම.






# ගණිත විනිවිදක පුවරුව






# ගණිත විනිවිදක පුවරුව

**නිපුණතාව** :- ගුණන වගු හඳුනාගෙන භාවිත කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ෆ්ලෙක්ස් රෙද්දක්
- කාඩ්බෝඩ්
- නූල්
- කතුරු
- මාකර් පෑන්
- පොලිතීන්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- 100cm x 90cm දිගින් හා පළලින් යුත් රෙක්සින් වර්ගයේ රෙද්දක් සපයා ගන්න.
- එම ප්‍රමාණයේ ම විනිවිද පෙනෙන ඝනකම් පොලිතීන් රෙද්දක් සපයා ගන්න.
- පහත රූපයේ දැක්වෙන ආකාරයට රෙක්සින් රෙද්ද මත පොලිතීන් රෙද්ද තබා තිරස් අතට කොටු 12ක් ද, සිරස් අතට කොටු 11ක් ද වන අයුරින් කොටු දැලක් පයිපින් කරගන්න.
- එසේ පයිපින් කර ගැනීමේ දී සෑම කොටුවක් ම පොකට්ටුවක් ලෙස ඒ තුළ කාඩ්පතක් රැඳවිය හැකි පරිදි ඉහළින් මැහුම් නොයෙදීමට වගබලා ගන්න.






### II පියවර :

- ඉහත පොකැට්ටු තුළ රැඳවාලිය හැකි පරිමාණයකින් යුත් එක් වර්ණයකින් 1 සිට 10 දක්වා සංඛ්‍යා කාඩ්පත් එකකින් දෙකක් වන පරිදි සකසා ගන්න.
(සංඛ්‍යා සකස් කිරීමේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ හඳුන්වා දී ඇති ඉලක්කම් භාවිත කරන්න.)

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 |

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 |

- 1 - 100 තෙක් වෙනස් වර්ණයකින් කාඩ්පත් කට්ටලයක් සකස් කරගන්න.

### III පියවර :

- පොකට්ටු තුළ රැඳවාලිය හැකි තරමින් යුත් ගණිත කර්ම සංකේත ලියූ කාඩ්පත් පහත අන්දමින් සකසා ගන්න.

| | |
|---|---|
| × | + |

## IV පියවර :

- සාදා ගත් විනිවිදක පුවරුවේ 1 - 10 තෙක් වූ කාඩ්පත් වර්ග දෙක පහත රූපයේ දැක්වෙන ආකාරයට රඳවන්න.
- ගණිත කර්ම සංකේතය සටහන් කාඩ්පත් ද අදාළ පොකැට්ටුවේ බහාලන්න.




**ක්‍රියාකාරකම :-**

- ගණිත විනිවිදක පුවරුව ක්‍රියාකාරකම් කාමරයේ බිත්තියක ප්‍රදර්ශනය කරන්න.
- සකස් කරගත් සංඛ්‍යා කාඩ්පත් කණ්ඩායම්වලට සපයන්න.
- දැලිස රටාව අනුව යමින් එක් එක් සංඛ්‍යාවල ගුණාකාරයන්ට අදාළ සංඛ්‍යා කාඩ්පත් විනිවිදක පුවරුවේ නිවැරදි පොකට්ටු තුළ රැඳවීමට සිසුන් යොමු කරන්න.



විනිවිදක පුවරුව
× 1 2 3 4 5 6 7 8 9 10
1 1 2 3 4 5 6 7
2 2 4 6 8 10
3 3 6 9 12 15
4 4 8 12
16
5
20

## විකාශන අවස්ථා 01

**නිපුණතාව :-** තොරතුරු තීර ප්‍රස්තාර මගින් නිරූපණය කරයි. නිරූපිත තොරතුරු විග්‍රහ කරයි.

**උපකරණ සැකැස්ම :-**
කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-**

- පන්ති කාමරයේ සිසුන් කැමති කැවිලි වර්ග විමසා එකී තොරතුරු විනිවිදක පුවරුව ඇසුරෙන් රූපික ප්‍රස්තාරයක හා තීර ප්‍රස්තාරයක දැක්වීමට සිසුන් යොමු කරවන්න.

- ඒ සඳහා කැවිලිවල රූප ඇඳි කාඩ්පත්, කැවිලිවල නම් කාඩ්පත්, සංඛ්‍යා කාඩ්පත් පහත අයුරින් විනිවිදක පුවරුවේ රඳවමින් රූපික ප්‍රස්තාරය නිරූපණය කිරීමට සිසුන්ට පවරන්න.



- එසේ ම විවිධ වර්ණ කාඩ්පත් හා සංඛ්‍යා කාඩ්පත් පහත අයුරින් විනිවිදක පුවරුවේ රඳවමින් තීර ප්‍රස්තාර ගොඩනැගීමට සිසුන්ට උපදෙස් දෙන්න.




## විකාශන අවස්ථා 02

**නිපුණතාව :-** සංඛ්‍යා රටා ගොඩනගයි.

**උපකරණ සැකැස්ම :-**

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-**

- පොදු අන්තරය 2 සිට 5 තෙක් වූ හා 10 වූ සංඛ්‍යා රටා ගොඩනැංවීමට අදාළ සංඛ්‍යා කාඩ්පත් තෝරා විනිවිදක පුවරුවේ පොකට්ටු තුළ රැඳවීමෙන් සංඛ්‍යා රටා ගොඩ නැංවීමට සිසුන්ට පවරන්න.



**විෂය ක්ෂේත්‍රය :** මව්බස / ඉංග්‍රීසි

**විකාශන අවස්ථා 03**

**උපකරණ සැකැස්ම :-**

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-**

- සිංහල අකුරු සහිත කාඩ්පත් භාවිත කරමින් ගුරුවරයා දෙනු ලබන ඉඟිවලට අදාළව හිස් අකුරු සම්පූර්ණ කර වචන ගොඩනඟා ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමට සිසුන්ට පවරන්න.




**විකාශන අවස්ථා 04**

**උපකරණ සැකැස්ම :-**

කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-**

- ඉංග්‍රීසි අකුරු කාඩ්පත් භාවිත කරමින් පළමු, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී හැදෑරිය යුතු ඉංග්‍රීසි පාරිභාෂික වචන විනිවිදක පුවරුවේ ගොඩනැංවීමට සිසුන් යොමු කරන්න.



# රූකඩ රඟහල





# රූකඩ රඟහල

**නිපුණතා** :- අවබෝධ කරගත් දේ භාවිතයෙන් නිර්මාණශීලීව හා අවස්ථාවෝචිත ව කතා කරයි.
කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.
සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන් දෙයි.

**ස්වරූපය** :- කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ලී / යකඩ
- ඇණ
- තිර රෙදි

**උපකරණ සැකැස්ම :-**

**I පියවර :**
- පහත රූපයේ දැක්වෙන ආකාරයට 2" × 2" ප්‍රමාණයේ ලී හෝ යකඩ වලින් 120cm ක් දිග හා 90cm ක් පළල වන සේ රාමුවක් සකස් කරගන්න.
- මෙම රාමුව පොළොව මට්ටමේ සිට 100cm - 150cm අතර උසකින් යුක්තව රැඳවා තැබිය හැකි ආකාරයේ ආධාරකයකට සවි කර ගන්න.
- සකස් කළ සැකිල්ල සුදුසු පරිදි තිර රෙදි යොදමින් කුඩා රඟහලක් ලෙස සකස් කරගන්න.



**ක්‍රියාකාරකම :-** මෙම රඟහල තුළ පහත දැක්වෙන අන්දමේ රූකඩ භාවිත කරමින් භූමිකා රංගන ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

**රූකඩ වර්ග 01 :- බැලුන් රූකඩ**

විවිධ වර්ණ බැලුන්වල පහත දැක්වෙන අන්දමින් එක් එක් සතුන්ට අදාළ මුහුණුවල අංග අලවා ගැනීමෙන් බැලුන් රූකඩ පහත අයුරින් නිර්මාණය කරගන්න.





එකී බැලුන් රූකඩ රඟහලෙහි දර්ශන තලයෙහි නිරූපණය වන අයුරින් රඟහලට පිටුපසින් සිට මුවා වෙමින් සිසුන් භූමිකා රංගනයට යොමු කරවන්න.




**රූකඩ වර්ග 02 :- ඇඟිලි රූකඩ**

උදාහරණ ලෙස පහත අන්දමේ පියවරයන් අනුගමනය කරමින් ඇඟිලි රූකඩ නිර්මාණය කරන්න. සරල දෙබස් හා වාක්‍ය ඛණ්ඩ කියමින් රඟ දැක්වීමට සිසුන් යොමු කරවන්න.

**උදා. 01 :-**



**ඇඟිලි රූකඩ නිර්මාණය කිරීමේ ආකාරයන්.**

උදා. 02 :-



උදා. 03 :-



උදා. 04 :-



## රූකඩ වර්ග 03 :- හැඳි රූකඩ

පහත රූපවල දැක්වෙන ආකාරයට පොල් කටු හැඳි සහ විවිධ ආකාරයේ හැඳි භාවිත කරමින් හැඳි රූකඩ නිර්මාණය කරගන්න.

**උදා. 01 :-**



**උදා. 02 :-**



## රූකඩ වර්ග 04 :- නූල් රූකඩ

පහත රූපවල දැක්වෙන ආකාරයට නූල් රූකඩ නිර්මාණය කරගන්න.



# සෙවණැලි රූපාගාරය





# සෙවණැලි රූපාගාරය

**නිපුණතා** :- 
- අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලීව හා අවස්ථාවෝචිතව කතා කරයි.
- සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.
- සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන් දෙයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- කාඩ්බෝඩ් පෙට්ටියක්
- මැලියම්
- කාඩ්බෝඩ්
- මාකර් පෑන්
- කතුරු
- විදුලි මේස ලාම්පුවක්

**උපකරණ සැකැස්ම** :-
- මෙම සෙවණැලි රූපාගාරය ස්ථිර ලෙස චීප් බෝඩ් වැනි තුනී තහඩුවලින් සකසා ගත හැකි ය. පහත දක්වා ඇත්තේ හිස් කාඩ්බෝඩ් පෙට්ටියක් යොදා ගනිමින් සරල ලෙස එය නිර්මාණය කර ගන්නා ආකාරය යි.

**I පියවර :**
- විශාල ප්‍රමාණයේ හිස් කාඩ්බෝඩ් පෙට්ටියක් ගෙන එය පහත දැක්වෙන ආකාරයට අර්ධයක් කපා ඉවත් කර ගන්න.



**II පියවර :**
- රූපාගාරය සැකසීම පිණිස එසේ කපා වෙන් කර ගනු ලැබූ එක් අර්ධයක් යොදා ගැනේ. එහි වැසී ඇති මුහුණතෙන් සමචතුරස්‍රාකාර හැඩතලයක් ජනෙල් කවුළුවක් ලෙස කපා ඉවත් කරගන්න.



III පියවර :

- කපාගත් ජනෙල් කවුළුව ආවරණය වන සේ තුනී සුදු කඩදාසියකින් ඇතුළු පැත්ත ආවරණය කරගන්න.



- දැන් එය සරල රූපවාහිනියක් සේ පහත ආකාරයට දිස්වනු ඇත.



IV පියවර :

- ඝනකම් කාඩ් බෝඩ්වලින් අවශ්‍ය ආකාරයේ රූකඩ හැඩතල කපා වෙන් කරගන්න. ඒවා ගම් ටේප් මගින් දඬුවලට සවි කර දඬු රූකඩ සකසා ගන්න.



V පියවර :

- ක්‍රියාකාරකම් කාමරයේ තිර රෙදිවලින් ආවරණය කළ අඳුරු අන්තයක මෙම සෙවණැලි රූපාගාරය සිසුන්ගේ ඇස් මට්ටමේ ස්ථානගත කරන්න. ඊට පිටුපසින් විදුලි මේස ලාම්පුවක් තබන්න.



ක්‍රියාකාරකම :-

- විදුලි මේස ලාම්පුවත් සෙවණැලි රූපාගාරයත් අතර අවකාශයේ සාදාගත් රූකඩ හැඩතල චලනය කරවිය හැකි ය. ප්‍රේක්ෂකයින් කඩදාසි තිරය ඉදිරියේ රඳවා අදාළ සෙවණැලි නිරූපණ නැරඹීමට සලස්වන්න.

- කපා වෙන් කර ගත් සත්ත්ව රූප හා මිනිස් රූපවල අනුරූ සෙවණැලි තිරය මත රූකඩ ඇසුරෙන් නිර්මාණය කරවමින් නිර්මාණාත්මක දෙබස් ඛණ්ඩ පහත අයුරින් පැවසීමට සිසුන් යොමු කරවන්න.



**විෂය ක්ෂේත්‍රය :-** ගණිතය

**විකාශන අවස්ථා 01**

**නිපුණතාව :-** සංඛ්‍යා හඳුනාගෙන අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.
**උපකරණ සැකැස්ම :-** ඉලක්කම් සහ සත්ත්ව හෝ ද්‍රව්‍ය රූප ඝනකම් කඩදාසිවලින් කපා ඉරටුවල රඳවා ගන්න.

**ක්‍රියාකාරකම :-** එම අනුරූවලින් චිත්‍රාගාරයේ තිරය මත සෙවණැලි නිර්මාණය කරමින් රූප / ද්‍රව්‍ය සංඛ්‍යාවට අදාළ සංඛ්‍යාංකය හා සංඛ්‍යාංකයට අදාළ ද්‍රව්‍ය / රූප සංඛ්‍යාව පිළිබඳ අවබෝධය තහවුරු කරනු පිණිස අදාළ දෙබස් ඛණ්ඩ පහත අයුරින් පැවසීමට සිසුන් යොමු කරවන්න.




**විකාශන අවස්ථා 02**

**නිපුණතා :-**
- සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳයි.
- සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි.

**ක්‍රියාකාරකම :-** කපා වෙන් කර ගත් රූපවල අනුරූ ඇසුරෙන් නිර්මාණය කර ගන්නා සෙවණැලි චලනය කිරීම මඟින් රූප සංඛ්‍යා එකතු කිරීම හා අඩු කිරීම පිළිබඳ අවබෝධය තහවුරු කරනු පිණිස පහත අයුරින් දෙබස් ඛණ්ඩ පැවසීමට සිසුන් යොමු කරවන්න.






**විෂය ක්ෂේත්‍රය** :- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

**විකාශන අවස්ථා 03**

**නිපුණතාව** :- සතුන්ගේ විවිධ ලක්ෂණ හා හැසිරීම් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** :- විවිධ පක්ෂීන් හා ඔවුන්ගේ පාදවලට අදාළ රූපවල අනුරූ ඇසුරෙන් නිර්මාණය කරගන්නා සෙවණැලි මගින් අදාළ පක්ෂීන් හා ඔවුන්ගේ පාද වෙන් කොට හඳුනාගැනීමට සිසුන්ට පවරන්න.






# භාග මංජුසාව





# භාග මංජුසාව

**නිපුණතා** :- ● සම්පූර්ණ ඒකක කොටසක් වශයෙන් බාගය හා කාල පෙන්වයි.
● දෙකෙන් පංගු, හතරෙන් පංගු සහ දහයෙන් පංගුවලට අදාළ භාග හඳුනාගෙන නම් කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- ලී
- ඇණ
- සායම්
- නූල්

**උපකරණ සැකැස්ම :-**

**I පියවර :**
- 60cm හා 40cm පළලින් යුත් ලෑලි පුවරු දෙකක් සකස් කරන්න. පාදක පුවරුව හැඩතල රැඳවීමටත්, අනෙක් පුවරුව පියන ලෙසත් භාවිත කෙරේ.

**II පියවර :**
- පාදක පුවරුව ඝනකම් ලෑල්ලකින් සකස් කළ යුතු අතර, එහි වෘත්තාකාර ආවාට පහත පරිදි සකස් කළ යුතු ය.



III පියවර :

- මෙම ආවාටවලට බහාලිය හැකි ආකාරයට ලී වලින් පහත ආකාරයේ හැඩ කපා වෙන් කළ යුතු අතර, ඒවා අල්ලා ගැනීමේ පහසුව සඳහා බෝල්ට් ඇණ යෙදිය යුතු වේ.






IV පියවර :

- පාදක පුවරුව සඳහා පියන අසව් මගින් පහත ආකාරයට සකස් කරගන්න. එහි තිරස් ලී රාමුවක් සවි කළ යුතු වේ. (ක්‍රියාකාරකම් සිදු කරන අතරතුර හැඩ රඳවා තබා ගැනීම පිණිස)





- පාදක පුවරුව හා පියන යම් ආනතියකින් පවත්වාගෙන යෑම පිණිස එකී කොටස් ඝනකම් නූල් මගින් එකිනෙකට සවි කරගන්න.

ක්‍රියාකාරකම :-

- භාග මංජුසාවේ ඇති වෘත්තාකාර සම්පූර්ණ කොටස ආධාරකය මගින් ඔසවා පෙන්වමින් එය සම්පූර්ණ එක බව හඳුන්වා දෙන්න.
- භාග මංජුසාවෙහි අර්ධ වෘත්තාකාර කොටස් දෙක ආධාරකය මගින් ඔසවමින් එය සම්පූර්ණ එක බහාලූ ආවාටය තුළ දැමිය හැකි බව හඳුන්වා දෙන්න.
- එසේම වෙන් කරනු ලබන හැඩතලය සමස්ත රූපයෙන් කවර භාගයක් ද යන්න දක්වන්න.
- ඒ අනුව භාග දෙකක් එක් වීමෙන් සම්පූර්ණ එක නිර්මාණය වන බව පෙන්වන්න.




- මේ අයුරින් ම කාල (1/4) දැක්වෙන හතරකට වෙන් කරන ලද කොටස් පෙන්වමින් හා එය සම්පූර්ණ එක බහා ලූ ආවාටය තුළ දැමිය හැකි බව දක්වන්න.
ඒ අනුව කාල 4ක් එකතු වීමෙන් සම්පූර්ණ එක නිර්මාණය වන බව පෙන්වන්න.
- භාගය හා කාල හඳුනාගත් පසු ඒ දෙක අතර ලොකු කුඩා බව හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ අයුරින් ම 10හි භාගය ද හඳුන්වා දෙන්න.
- ගණිත කර්ම භාවිත කිරීමෙන් තොරව පාදක පුවරුවෙහි විවිධ ආවාටවල හැඩතල රැඳවීමෙන් භාග එකතු කිරීම හා අඩු කිරීමට යොමු කරන්න.

# ඉලක්ක පුවරුව





# ඉලක්ක පුවරුව

**නිපුණතාව** :- ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් උප ලක්ෂණයක් (වර්ගය, පාට, හැඩය හා තරම) අනුව ගොඩවලට වෙන් කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-

- MDF එලක
- වයිට් බෝඩ් එලක
- සෙල්ලම් රබර් උණ්ඩ විදිනය
- ත්‍රිමාණ ජ්‍යාමිතික හැඩතල
- කාඩ්බෝඩ්
- මාකර් පෑන්

**උපකරණ සැකැස්ම** :-

- රූපයේ දැක්වෙන ආකාරයට MDF බෝඩ් එකකින් හා වයිට් බෝඩ්වලින් විෂ්කම්භය 40cmක ප්‍රමාණයේ වෘත්ත දෙකක් කපා වෙන් කර ගන්න.




MDF වෘත්තය




වයිට්බෝඩ් වෘත්තය

- වයිට්බෝඩ් වෘත්තය MDF වෘත්තය මත හොඳින් අලවා ගන්න.



- ඉන්පසු වෘත්තය සමාන කොටස් හතරකට බෙදා වෙන් කර ඉරි ඇඳගන්න.
- එසේ සකස් කර ගත් වෘත්තය ඉලක්ක පුවරුවක් ලෙස සිටුවාලිය හැකි සේ ආධාරකයකට සවි කරගන්න.
- පහත ක්‍රියාකාරකම්වල දී මෙම වෘත්තාකාර පුවරුව රබර් උණ්ඩ විදිනයක ඉලක්ක පුවරුවක් ලෙස භාවිත කෙරෙනු ඇත.



## ක්‍රියාකාරකම :-

- පහත දැක්වෙන අයුරින් වෘත්තාකාර වයිට් බෝඩ් ඵලකය මත ත්‍රිමාණ ජ්‍යාමිතික හැඩතලවලට අදාළ රූ සටහන් ඇඳගන්න.



- විවිධ වර්ණවලින් එක වර්ගයකින් එකකට වඩා වැඩි ගණනකින් යුක්තව ජ්‍යාමිතික හැඩ පෙට්ටියකට බහාලන්න.
- සෙල්ලම් උපකරණයක් ලෙස වෙළෙඳ පොළෙහි අලෙවියට ඇති චූෂක උණ්ඩ විදිනයක් සපයා ගන්න.
- පන්තියේ සිසුන් පහත අයුරින් කණ්ඩායම් 4කට වෙන් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| I | කණ්ඩායම | - | ඝනක කණ්ඩායම |  |
| II | කණ්ඩායම | - | ඝනකාභ කණ්ඩායම |  |
| III | කණ්ඩායම | - | සිලින්ඩර කණ්ඩායම |  |
| IV | කණ්ඩායම | - | ගෝල කණ්ඩායම |  |

- සෑම කණ්ඩායමක සාමාජිකයෙකුට ම මාරුවෙන් මාරුවට අවස්ථා ලබා දෙමින් චූෂක උණ්ඩ විදිනය මඟින් ඉලක්ක පුවරුව මතට චූෂක උණ්ඩ මුදා හැරීමට අවස්ථාව ලබා දෙන්න.
- යම් තරගකරුවකුගේ චූෂක උණ්ඩය ඉලක්ක පුවරුවේ අදාළ ජ්‍යාමිතික හැඩ සීමාවේ ඇලවුණහොත් ඊට අදළ හැඩය පොදු පෙට්ටියේ ඇති හැඩවලින් තෝරා තම කණ්ඩායම සතු කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇත.
- චූෂක උණ්ඩ විදීමෙන් 'තම කණ්ඩායමට හිමි හැඩ' පමණක් වැඩි ම ප්‍රමාණයක් රැස් කර ගත් කණ්ඩායම ජයග්‍රහණයට පූර්ව සුදුසුකම් ලබනු ඇත. ජයග්‍රහණය සම්පූර්ණ වීමට නම් එකී කණ්ඩායමේ සෑම සාමාජිකයෙකු විසින් ම තමා දිනාගත් හැඩයට අදාළ සියලු ම ලක්ෂණ සෙසු අය ඉදිරියේ ප්‍රකාශ කළ යුතු ය.
  (සැ.යු. :- මෙම ජ්‍යාමිතික හැඩවලට අතිරේකව චතුස්තල හැඩය ද යොදා ගත හැක.)
- තම කණ්ඩායමට හිමි හැඩවලින් අඩු සංඛ්‍යාවක් රැස් කර ගත් කණ්ඩායම්වල ද සියලු ම සාමාජිකයන් තමන්ට හිමිවූ හැඩයට අදාළ සියලු ම ලක්ෂණ විස්තර කිරීමෙන් ඊළඟ ජයග්‍රාහී ස්ථාන ලබා ගත හැකි ය.

## විකාශන අවස්ථා 01

**නිපුණතාව** :- පාට අනුව ගොඩවලට වෙන් කරයි.

**උපකරණ සැකැස්ම** :- පළමු ක්‍රියාකාරකමෙහි සඳහන් පරිදි මෙම විකාශන අවස්ථාවට ගැළපෙන ලෙස උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම** :- පළමු ක්‍රියාකාරකමෙහි පියවර අනුගමනය කරමින් ක්‍රියාකාරකම සිදුකරන්න.



I කණ්ඩායම - රතු කණ්ඩායම

II කණ්ඩායම - නිල් කණ්ඩායම

III කණ්ඩායම - කහ කණ්ඩායම

IV කණ්ඩායම - කොළ කණ්ඩායම

## විකාශන අවස්ථා 02

**නිපුණතාව** :- තරම අනුව ගොඩවලට වෙන් කරයි.

**උපකරණ සැකැස්ම** :- පළමු ක්‍රියාකාරකමෙහි සඳහන් පරිදි මෙම විකාශන අවස්ථාවට ගැළපෙන ලෙස උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම** :- පළමු ක්‍රියාකාරකමෙහි පියවර අනුගමනය කරමින් ක්‍රියාකාරකම සිදුකරන්න.



I කණ්ඩායම - ලොකු සමචතුරස්‍ර කණ්ඩායම

II කණ්ඩායම - කුඩා සමචතුරස්‍ර කණ්ඩායම

# කැරකෙන බමරය





# කැරකෙන බමරය

**නිපුණතාව** :- ඝන වස්තු හා ජ්‍යාමිතික හැඩතලවල ලක්ෂණ හා ස්වභාවය හඳුනාගෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-

- ලී
- ඇණ
- කියතක්
- මිටියක්
- ලී අලවන ගම් වර්ග
- සායම් වර්ග
- කාඩ්බෝඩ් කැබලි
- වෙල්කෝ ටේප්
- තුනී ලෑලි

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- පහත රූපයේ දැක්වෙන ආකාරයේ පරිමාණයට මුහුණත් 6ක් සහිත ත්‍රිමාණ ෂඩස්‍රාකාර ඝන වස්තු කිහිපයක් ලී වලින් කපා වෙන් කරගන්න. එහි සෑම මුහුණතක ම වෙල්කෝ ටේප් කැබලි අලවා ගන්න.




**II පියවර :**

- 13cm ක් පමණ උසකින් යුත් ආධාරක ෂඩස්‍රාකාර ඝන වස්තුවල මැදින් සවි කර ගන්න.



### III පියවර :

- පහත දැක්වෙන පරිමාණයන්ට අනුව 75cm x 15cm දිගින් සහ පළලින් යුත් සෘජුකෝණාස්‍රාකාර ලී පාදමක් සකසා ගන්න. එහි සමාන දුරින් යුතු කුහර 5ක් සකස් කර ගන්න. (ෂඩස්‍රාකාර ඝන වස්තුවල ආධාරක අක්ෂ පාදමෙහි ඇති කුහර තුළ භ්‍රමණය කරමින් සීරුෑ මාරුෑ කිරීමට හැකි විය යුතු ය.)




### IV පියවර :

- පහත දිගින්, පළලින් හා උසින් යුත් එක් පැත්තක් විවෘත පෙට්ටියක් තුනී ලෑලිවලින් සකසා ගන්න. එහි දක්වා ඇති ආකාරයේ දිගින් හා පළලින් යුත් සෘජුකෝණාස්‍රාකාර කවුළු පැත්තෙන් ද, ඉහළින් සිදුරුෑ ද සකස් කරගන්න. (සිදුරුෑ තුළින් ෂඩස්‍රාකාර ඝන වස්තුවල ආධාරක අක්ෂ රිංග විය හැකි විය යුතු ය.)




### V පියවර :

- එසේ සාදා ගත් පෙට්ටිය පහත පෙනෙන පරිදි ඝන වස්තු ආවරණය වන අයුරින් ඉහළින් සවි කරන්න. උපකරණය නිවැරදිව සකසා ගත් විට ෂඩස්‍රාකාර ඝන වස්තුවේ මුහුණත් ආවරණ පෙට්ටියේ ඉදිරි කවුළුවකින් දෘශ්‍යමාන විය යුතු ය.



**ක්‍රියාකාරකම :**

- 7cm x 3cm ප්‍රමාණයේ සෘජුකෝණාස්‍රාකාර කාඩ්බෝඩ් කැබලි කපා ඒවායේ පහත දැක්වෙන මාතෘකාවලට අදාළව රූ සටහන් හා වචන සඳහන් කරන්න. හැඩ වස්තුවල රේඛාමය පෙනුම දැක්වෙන රූප, හැඩ වස්තුවල නම්, හැඩ වස්තුවල දාර සංඛ්‍යා, හැඩ වස්තුවල ශීර්ෂ සංඛ්‍යා, හැඩ වස්තුවල මුහුණත් සංඛ්‍යා)

- ඒවායේ පිටුපස වෙල්කෝ ටේප් කැබලි අලවා ගන්න.

**උදා :-**




- ඉහත කාඩ් බෝඩ් කැබලි ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් මත වෙල්කෝ ටේප්වලින් අලවා ගන්න.




- ෂඩස්‍රාකාර ඝන වස්තුවල අක්ෂ පාදම පුවරුවේ ඇති කුහර තුළ පහත පරිදි ස්ථානගත කරන්න. ඉන් පසු ආවරණ පෙට්ටිය මගින් ෂඩස්‍රාකාර වස්තූන් ආවරණය කරන්න.




- ෂඩස්‍රාකාර ඝන වස්තුව අක්ෂ ඔස්සේ සීරුමාරු කරමින් ක්‍රියාකාරකම කිරීමට සිසුන්ට පවරන්න.

- පළමුව ෂඩස්‍රාකාර ඝන වස්තුවේ එක් මුහුණතක සටහන්ව ඇති ජ්‍යාමිතික හැඩයේ රේඛාමය සටහන කවුළුව තුළින් දෘෂ්‍යමාන වන සේ එය සීරු මාරු කරවන්න.
- ඉන් පසු එකී ජ්‍යාමිතික හැඩයට අදාළ සෙසු ලක්ෂණ (නම, දාර සංඛ්‍යා, ශීර්ෂ සංඛ්‍යා, මුහුණත් සංඛ්‍යා) අනුයාත කවුළු තුළින් නිරූපණය වන ආකාරයට සෙසු ෂඩස්‍රාකාර ඝන වස්තු සීරු මාරු කරමින් මුහුණත් ගළපා පෙන්වීමට සිසුන්ට පවරන්න.
- එසේ ම සිසුන්ගේ උස මට්ටමට ගැළපෙන උසක තබා මෙය ක්‍රියාත්මක කිරීමට පවරන්න.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

## විකාශන අවස්ථා 01

**නිපුණතාව** :- සංඛ්‍යා හඳුනාගෙන අවබෝධයෙන් යුතුව භාවිත කරයි.

**උපකරණ සැකැස්ම** :- කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස්කර උපකරණය සකසා ගන්න.

| | | |
|---|---|---|
| I ඝන වස්තුව | - | පෙර සංඛ්‍යාව |
| II ඝන වස්තුව | - | සංඛ්‍යාව |
| III ඝන වස්තුව | - | පසු සංඛ්‍යාව |







**ක්‍රියාකාරකම** :- පෙර හා පසු සංඛ්‍යා පිළිබඳ අවබෝධය තහවුරු කිරීම පිණිස ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් සීරුමාරු කරවමින් ක්‍රියාකාරකම කිරීමට සිසුන් යොමු කරවන්න.

## විකාශන අවස්ථා 02

**නිපුණතාව** :- සංඛ්‍යා හඳුනාගෙන අවබෝධයෙන් යුතුව භාවිත කරයි.

**උපකරණ සැකැස්ම** :- කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

| | | |
|---|---|---|
| I ඝන වස්තුව | - | ඉලක්කම් හතරේ සංඛ්‍යාව |
| II ඝන වස්තුව | - | දහසේ ස්ථානයට අයත් ඉලක්කම |
| III ඝන වස්තුව | - | සියයේ ස්ථානයට අයත් ඉලක්කම |
| IV ඝන වස්තුව | - | දහයේ ස්ථානයට අයත් ඉලක්කම |
| V ඝන වස්තුව | - | එකේ ස්ථානයට අයත් ඉලක්කම |






**ක්‍රියාකාරකම :-** යම් සංඛ්‍යාවක ස්ථානීය අගය පිළිබඳ අවබෝධය තහවුරු කිරීම පිණිස ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් සීරුමාරු කරවමින් ක්‍රියාකාරකම් සිදු කිරීමට සිසුන්ට පවරන්න.

**විෂය ක්ෂේත්‍රය :-** මව්බස

**විකාශන අවස්ථා 03**

**නිපුණතාව :-** සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි.

**උපකරණ සැකැස්ම :-** කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**සමානාර්ථ පද :-**




**ක්‍රියාකාරකම :-** යම් නාම පදයකට සමානාර්ථ පද මොනවා ද යන්න තහවුරු කිරීම පිණිස ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් සීරු මාරු කරමින් ක්‍රියාකාරකම සිදු කිරීමට සිසුන් යොමු කරවන්න.

I රෝදය - නාම පදයක්
II රෝදය - නාම පදයට සමානාර්ථ පදය
III රෝදය - නාම පදයට සමානාර්ථ පදය
IV රෝදය - නාම පදයට සමානාර්ථ පදය

**විරුද්ධාර්ථ පද :-** විරුද්ධාර්ථ පද ඉගැන්වීමේ දී ෂඩස්‍රාකාර ඝන වස්තු දෙකක් පමණක් භාවිත කරන්න.



## විකාශන අවස්ථා 04

**නිපුණතාව** :- සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.

**උපකරණ සැකැස්ම** :- කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

| | | |
|---|---|---|
| I ඝන වස්තුව | - | පිල්ල |
| II ඝන වස්තුව | - | පිල්ල යෙදුණු වචනයක් |
| III ඝන වස්තුව | - | පිල්ල යෙදුණු වචනයක් |
| IV ඝන වස්තුව | - | පිල්ල යෙදුණු වචනයක් |



**ක්‍රියාකාරකම :-** යම් පිල්ලක් හා එකී පිල්ල යෙදුණු අකුරුවලින් යුත් වාග් කෝෂය පුළුල් කරනු පිණිස ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් සීරු මාරු කිරීම මගින් ක්‍රියාකාරකම සිදු කිරීමට සිසුන්ට පවරන්න.

## විකාශන අවස්ථා 05

**නිපුණතාව** :- සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි.

**උපකරණ සැකැස්ම** :- කලින් ක්‍රියාකාරකම්වල දැක්වූ පියවර මෙම විකාශන අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කර උපකරණය සකසා ගන්න.

**ක්‍රියාකාරකම :-** සරල වගන්ති ගොඩනැගීමේ කුසලතාව සංවර්ධනය කරනු පිණිස ෂඩස්‍රාකාර ඝන වස්තුවල මුහුණත් සීරු මාරු කිරීම මගින් ක්‍රියාකාරකම සිදු කිරීමට සිසුන්ට පවරන්න.

| | | |
|---|---|---|
| I ඝන වස්තුව | - | නාම පදය (උක්ත පදය) / නාම විශේෂණ පදය |
| II ඝන වස්තුව | - | කර්ම පදය |
| III ඝන වස්තුව | - | ආඛ්‍යාතය |












**උදා :-** අපි වැඩිහිටියන්ට ගරු කරමු, අපි කෑමට පෙර අත් සෝදමු, අපි පොදු දේවල් සුරකිමු.

# සිරිමත් පුවරුව





# සිරිමත් පුවරුව

**නිපුණතාව** :- තමාගේ හා අනෙක් අයගේ යහපැවැත්මට අදාළ පුරුදු අනුගමනය කරයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- සුමට කරන ලද ලෑල්ලක්
- රිප්ප
- ඇණ
- ඩිස්ක් එකක්
- සායම්

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**
- 75cm x 75cm ප්‍රමාණයේ මතුපිට හොඳින් සුමට කරගන්නා ලද සමචතුරස්‍රාකාර ලෑලි පුවරුවක් සපයා ගන්න. එකී ලෑලි පුවරුවේ දාරය වටා කැරම් පුවරුවක් සේ ලී පටි සවිකර ගන්න.




**II පියවර :**
- සුමට කර ගන්නා ලද ලෑලි පුවරුව මතුපිට තලය මත රූපයේ දැක්වෙන ආකාරයට වර්ණ 4කින් කොටස් හතරකට වෙන් කර ගන්න.



### III පියවර :

- රූපයේ දැක්වෙන ආකාරයට එක් වර්ණයක් සහිත කොටසක් නැවත කොටස් 9කට බෙදා වර්ණ 4කින් ඉලක්කම් යොදන්න.



### IV පියවර :

- එකී ඉලක්කම්වලට අදාළව පහත අන්දමින් සිරිත් හා විරිත් ඇතුළත් වර්ණ කාඩ්පත් 4ක් සකසාගන්න.

1 - වැඩිහිටියෙකු එන විට අසුනෙන් නැගිටිනවා.
2 - කසළ තැන තැන දමනවා.
3 - සතුන්ට කරුණාව දක්වනවා.
4 - කිවිසුමක දී ලේන්සුවෙන් මුව වසා ගන්නවා.
5 - යමක් ලබා ගන්නා විට ස්තුතියි කියනවා.
6 - නිතර බොරු කියනවා.
7 - පන්තියේ කෑත වචන කතා කරනවා.
8 - ආගමික ස්ථානයකට ඇතුළු වන විට හිස්වැසුම් ගලවනවා.
9 - මිතුරාගේ ජයග්‍රහණයක දී සතුටු වෙනවා.

1 - කිලිටි ඇඳුම් නිතර අඳිනවා.
2 - පොත්වල කුරුටු බලි අඳිනවා.
3 - පොදු දේපළ සුරකිනවා.
4 - අන් අයට කරුණාවෙන් අමතනවා.
5 - තමා සිටින තැන කෙළ ගසනවා.
6 - අසරණ අයට උදවු කරනවා.
7 - ජලයට අපද්‍රව්‍ය නොදමා සිටිනවා.
8 - ගස්වැල් ආරක්ෂා කරනවා.
9 - පාසලේ සීනුවට අවනත වෙනවා.

1 - ජාතික ගීයට සීරුවෙන් සිටිනවා.
2 - සෙසු අයගේ ආගම්වලට ගරු කරනවා.
3 - පාසල් කොඩියට ගරු නොකරනවා.
4 - පුස්තකාලයේ ශබ්ද නගා කතා කරනවා.
5 - පෙළ පොත් ආරක්ෂා කර ගන්නවා.
6 - අන් අයගේ දෑ සොරකම් කරනවා.
7 - කණ්ඩායම් වැඩවලට දායක වෙනවා.
8 - ආහාර ගන්නා විට වතුර බොනවා.
9 - තමාට වඩා දුබල අයට සැම විට ම ඉඩ දෙනවා.

1 - ගත් දෙය නැවත මුල් තැන ම තබනවා.
2 - තමාට කැමති වේලාවට පන්තියෙන් පිටතට යනවා.
3 - පුරාවස්තු ආරක්ෂා කරගන්නවා.
4 - තමාට වඩා වැඩිහිටි අයට නමින් ම අමතනවා.
5 - ගුරු උපදෙස් පිළිපදිනවා.
6 - පාරේ දකුණෙන් ගමන් කරනවා.
7 - සැම විට ම පරක්කු වී වැඩ අරඹනවා.
8 - නායකයාට අණට කීකරු වෙනවා.
9 - පොදු වාහනවල ගමන් කරන විට නීති ගරුක වෙනවා.

**ක්‍රියාකාරකම :-** • කණ්ඩායම් දෙකක් ක්‍රීඩාවට සහභාගී කෙරෙන අතර, එකී කණ්ඩායම් නියෝජනය කරමින් ක්‍රීඩකයින් සිව් දෙනෙකු පුවරුවෙහි සිවු දිශාවෙහි එකිනෙකාට අභිමුඛව වාඩි කෙරේ. අභිමුඛව සිටින දෙදෙනා එක ම කණ්ඩායමකට අයත් වේ. මෙම තරගකරුවන්ට අතිරේකව සෙසු අය ද අදාළ කණ්ඩායම් දෙක නියෝජනය කෙරේ.



- ඒ අනුව සෑම ක්‍රීඩකයෙකුට ම තමාට අභිමුඛව පුවරුවෙහි ඇති වර්ණය හිමි වේ.
- එකී වර්ණයට අදාළව එම වර්ණයෙන් ම යුත් සිරිත් කාඩ්පත් ද ක්‍රීඩකයාට හිමි වේ.
- සුදු බොත්තම් 10 බැගින් කණ්ඩායම් දෙකට සැපයේ.
- ක්‍රීඩකයින්ට වරකට එක් වතාවක් බැගින් ඩිස්ක් එක පුවරුව මත ලිස්සා යැවීමට අවස්ථාව ලැබේ.
- එකී සෑම අවස්ථාවක දී ම සෑම ක්‍රීඩකයෙකු ම පුවරුවෙහි දාරයට වැදී පොලා පනින ආකාරයට ඩිස්ක් එක ඇඟිල්ලෙන් ලිස්සවා හළ යුතු වේ. එසේ ම සෑම විට ම තමාට අයත් වර්ණ සීමාවෙන් ඔබ්බට ඩිස්ක් එක පුවරුව මත ලිස්සවා හැරිය යුතු ය.
- ක්‍රීඩකයෙකු සෑම විට ම පුවරුවේ අංක 5 වර්ණ සීමාව මත ඩිස්ක් එක තබා ලිස්සා හැරීම ආරම්භ කළ යුතු ය.
- මෙසේ ඩිස්ක් එක පොලා පැනීම් පහරකින් පසු යම් අංකයක් මත නතර වූයේ නම් එකී අංකය හා ඊට අදාළ වර්ණය හඳුනාගත යුතු වේ. ඒ අනුව එම වර්ණයෙන් ම යුත් සිරිත් විරිත් කාඩ්පත් පරීක්ෂා කිරීමට කණ්ඩායමේ බාහිර සාමාජිකයෙකුට පැවරේ.
- එම අංකයට අදාළ කාඩ්පතෙහි සිරිතක් (කළ යුතු දෙයක්) ඇත්නම් එම වර්ණ සීමාවේ සිටින ක්‍රීඩකයා ඩිස්ක් එක එවූ කණ්ඩායමේ සාමාජිකයාට තම කණ්ඩායමෙන් සුදු බොත්තමක් ප්‍රදානය කෙරේ.

  යම් හෙයකින් එම අංකයට අදාළව කාඩ්පතෙහි ඇත්තේ විරිතක් (නොකළ යුතු දෙයක්) නම් ඩිස්ක් එක එවූ කණ්ඩායම් සාමාජිකයාට සුදු බොත්තමක් දිනා ගැනීමට අවස්ථාව අහිමි වේ.

- ඩිස්ක් එක පුවරුවේ අංක වෙන් කෙරෙන රේඛාවක් මත ස්ථානගත වූයේ නම් ඉත්තාගේ වැඩි කොටසක් අයත් වන වර්ණ පදාසයට හිමි අංකය ඩිස්ක් එක ස්ථානගත වූ අංකය ලෙස සැලකේ.
- යම් ක්‍රීඩකයෙකු තම ඩිස්ක් එක ලිස්සා යැවූ පසු නතර වූයේ තමාගේ ම වර්ණ සීමාවේ නම් එකී අවස්ථාව නිකරුණේ ගිලිහී ගිය අවස්ථාවක් ලෙස සැලකේ.
- ඉක්මනින් ම සුදු බොත්තම් සංඛ්‍යාවක් දිනා ගත් කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම ලෙස සැලකේ.
- සිරිත් විරිත් කාඩ්පත් ගුරුවරයාගේ අභිමතය පරිදි වරින් වර වෙනස් කරමින් ක්‍රීඩාව අලුත් කර ගැනීමට අවකාශ ඇත.

# පන්දු ඇසුරුම





# පන්දු ඇසුරුම

**නිපුණතාව** :- කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.

**ස්වරූපය** :- කේවල / කණ්ඩායම්

**අවශ්‍ය දෑ** :-
- මාකර් පෑන්
- විවිධ වර්ණ ප්ලාස්ටික් බේසම්
- කාඩ්බෝඩ්
- මැලියම්
- විවිධ වර්ණ කුඩා ප්ලාස්ටික් බෝල

**උපකරණ සැකැස්ම** :-

**I පියවර :**

- පහත දැක්වෙන නිර්දේශිත වචන නිවැරදි අංග හා ප්‍රමාණ සහිතව පන්දු පෘෂ්ඨය මත ලියූ විවිධ වර්ණ ප්ලාස්ටික් පන්දු 100ක් පිළියෙල කර ගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| කැලයට | කිකිළි | ළිඳට | කජු | හැලප | පොත |
| ආවා | බුබුළ | සාරදා | කටුව | සැරව | කොළය |
| කුරුඳු | තාරාවා | පාද | වතුර | කෑම | මොළය |
| මිටිය | කිරි | තබා | රුවල | නියෝගය | ලොව |
| පාරට | පොත | නිවිති | ගවුම | නැව | හොර |
| කනවා | පෝර | මිටිය | තරුව | කෝෂය | තොරණ |
| වීර | පෙළට | සිගිති | කියති | වෑදම | තේමාව |
| මිහිරි | පේර | නටයි | කුඩය | ගෙදර | කේතල |
| බෙරය | බෝලය | නංගි | කුඩය | පෙණ | කඩේ |
| මාලය | බෑගය | ළිඳට | දූපත | බෙරය | ජනේලය |
| මුහුදට | ගීතය | යනවා | මුහුණ | ලෙඩ | |
| හාවා | කඩලා | බීම | නූල | හෙර | |
| මාමා | ආඳා | ගීතය | රූපය | කොටය | |
| වතුර | සිහිනය | ගයනවා | රූකඩ | දොර | |
| පුටුව | නානවා | රිලව් | ගැටය | | |
| සීතල | මිදි | වීර | පැළ | | |
| ළමයා | බලනවා | නීරස | වැට | | |
| සාදනවා | ළමයි | රත්තී | | | |
| බීම | බිම | සීතල | | | |
| වෑවර | කඩනවා | අකුර | | | |
| මෝදර | පෝසතා | රෝදය | | | |



**II පියවර :**

- එසේ ම පන්දු 20ක් පමණ බහාලිය හැකි තරමින් යුත් විවිධ වර්ණවල කුඩා බේසම් 12ක් සපයා ගන්න. එකී බේසම්වල පහත ආකාරයට නම් සඳහන් කුඩා පුවරු බැගින් අලවා ගන්න.




**III පියවර :**

- පහත දැක්වෙන නිර්දේශිත වචන නිවැරදි අංග හා ප්‍රමාණ සහිතව ලියූ 15cm x 6cm ප්‍රමාණයේ ඝනකම් කාඩ්පත් 100ක් සකසා එහි පිටුපස වෙල්කෝ කැබලි අලවා ගන්න.

| | | | |
|---|---|---|---|
| කිකිළි | කැලය | පේර | පාද |
| ආවා | පොත | මුහුද | කොළය |
| තබා | තාරාවා | මාමා | රෝදය |

**ක්‍රියාකාරකම :-**

- ඉහත වචන ලියූ සියලු ම පන්දු විශාල බේසමට දැමිය යුතු අතර, කුඩා බේසම් ක්‍රියාකාරකම් කාමරයෙහි තැනින් තැන තබන්න.
- ගුරුවරයා හෝ පන්තියේ පත්කරගන්නා නායකයෙකු මගින් විශාල බේසමෙහි ඇති පන්දු ක්‍රියාකාරකම් කාමරය තුළ විසුරුවා හරින්න.
- මෙසේ විසිරුවමින් නලාව නාද කළ යුතු අතර කාමරයේ තැනින් තැන සිටින ළමුන් එම නලා නාදයට අනුව ක්‍රියාත්මක විය යුතු ය.
- එනම්, එක් සිසුවෙකුට එක් අවස්ථාවක් හෝ ගැළපෙන ආකාරයට ඊට වඩා වැඩි අවස්ථා ලබා දෙමින් බිම විසිරුණු පන්දු අහුලා ගැනීමට පැවරිය යුතු ය.
- තමා විසින් අහුලා ගත් පන්දුවෙහි මතුපිට ඇති වචනය නිවැරදිව කියවිය යුතු අතර, එහි අකුරුවල ඇති පිලිවලට අදාළ භාජනය තුළට එය දැමීම සිසුවා විසින් කළ යුතු ය.
- සිසුන් අහුලාගත් පන්දු නිවැරදිව ඇසුරුවේ ද යන්න නිරීක්ෂණය කරමින් සුදුසු උපස්ථම්භනය ලබා දෙන්න.

## විකාශන අවස්ථා

**නිපුණතාව :-** කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි..

**ක්‍රියාකාරකම :-**

- ඉහත ක්‍රියාකාරකමෙහි පිලි අනුව වර්ග කරනු ලැබූ වචන සහිත කුඩා බේසම් මෙම ක්‍රියාකාරකම සඳහා ද යොදවා ගන්න.
- ඉහත නිර්දේශිත වචන ලියූ 15cm x 6cm ප්‍රමාණයේ ඝනකම් කාඩ්පත් සියය පෙට්ටි කිහිපයකට බහාලන්න.
- පිලි අනුව වචන වර්ග කරනු ලැබූ බේසම් ද, කාඩ්පත් සහිත පෙට්ටි ද ඉදිරියෙන් තබන්න.
- ගුරුවරයා / නායකයා දෙන නලා නාද සංඥාවට අනුව එක් බේසමකින් වරකට එක් අයෙකු බෝලය බැගින් ගෙන දෙදෙනෙකු, තිදෙනෙකු හෝ සිව් දෙනෙකු ලෙස වූ කණ්ඩායම් ලෙස එකතු වෙමින් නිවැරදි අර්ථවත් වාක්‍යාංශ හෝ වාක්‍ය ගොඩනැගීමට අවශ්‍ය බෝල බඳුන්වලින් තෝරා ඉහළට ඔසවා පෙන්වීමට පවරන්න.
- සැදූ අර්ථවත් වාක්‍යාංශය හෝ වාක්‍යය ශබ්ද නගා කීමට පවරන්න.
- එසේම පන්දුවලින් සැදූ වාක්‍යාංශය හෝ වාක්‍යය පැනල් පුවරුව මත පෙට්ටිවලින් සොයාගත් කාඩ්පත්වලින් ගොඩ නැංවීමට උපදෙස් ලබා දෙන්න.






# ක්‍රියාකාරකම් කාමරය භාවිතය පිළිබඳ උපදෙස් සංග්‍රහය

**මඟපෙන්වීම**

| | | |
|---|---|---|
| ඒ.එස්. හේවගේ මහතා | - අතිරේක ලේකම් (පාසල් කටයුතු) | - අධ්‍යාපන අමාත්‍යාංශය |

**මෙහෙයවීම**

| | | |
|---|---|---|
| පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය | - අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන | - අධ්‍යාපන අමාත්‍යාංශය |

**සම්බන්ධීකරණය**

| | | |
|---|---|---|
| මානෙල් ගුණසිංහ මිය | - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන | - අධ්‍යාපන අමාත්‍යාංශය |
| එස්. ලලිතාම්බිගෙයි මිය | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන | - අධ්‍යාපන අමාත්‍යාංශය |
| අචිනි ඩී. බාලපටබැඳිගේ මිය | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන | - අධ්‍යාපන අමාත්‍යාංශය |
| කමල් හේරත් මයා | - අධ්‍යාපන උපදේශක | - ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය |

**උපදේශකත්වය**

| | | |
|---|---|---|
| වී.එන්.එස්. උදයශන්තිරන් මයා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව. ජාතික අධ්‍යාපන ආයතනය |
| එස්.එම්. සඳමාලි දේශප්‍රිය මිය | - කථිකාචාර්ය | - මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව. ජාතික අධ්‍යාපන ආයතනය |
| ජයන්ත වීරසිංහ මයා | - අධ්‍යක්ෂ | - පෙප් ලංකා (පුද්) සමාගම |

# ලේඛක මණ්ඩලය

පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය
- අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) - අධ්‍යාපන අමාත්‍යාංශය

මානෙල් ගුණසිංහ මිය
- නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) - අධ්‍යාපන අමාත්‍යාංශය

එස්. ලලිතාම්බිගෙයි මිය
- සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) - අධ්‍යාපන අමාත්‍යාංශය

අචිනි ඩී. බාලපටබැඳිගේ මිය
- සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) - අධ්‍යාපන අමාත්‍යාංශය

වී.එන්.එස්. උදයශන්තිරන් මයා
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය

එස්.එම්. සඳමාලි දේශප්‍රිය මිය
- කථිකාචාර්ය - මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,

| | |
|---|---|
| ජයන්ත වීරසිංහ මයා | - අධ්‍යක්ෂ - පෙප් ලංකා (පුද්) සමාගම |
| ඒ.එම්. දුමින්ද්‍රා වෑද්‍රණ්ඩ මිය | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල |
| ටී.එච්.ඒ. අතුල සිරිලාල් මයා | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - මහඔය |
| ස්වර්ණා ආනන්දශීලී මිය | - විදුහල්පති - තලංගම ලංකා සභා ක.වි. - බත්තරමුල්ල |
| ඩබ්.යූ.ඩී.එස්. හේරත් මයා | - විදුහල්පති - හෙන්රි ඕල්කට් ප්‍රා.වි. - අඹන්පොල |
| එස්.එම්. ගාමිණී ධර්මදාස මයා | - විදුහල්පති - අඹන්පොල ආදර්ශ ප්‍රා.වි. - අඹන්පොල |
| ජී.එච්. ප්‍රේමරත්න මයා | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වැ.බ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර |
| ඩබ්.එම්. රෝහිණී චිත්‍රලතා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ගිරිඋල්ල |
| එච්.එම්. සුනිල් ප්‍රේමරත්න මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මහව |
| ඒ.එච්.එම්. කුමාරදාස මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - පුත්තලම |
| වයි.ඒ.ඩී. ගර්ට් විජේරත්න මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය |
| ඩබ්.ඩී.ජී.එම්.ටී. සිරිකුමාරි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට |
| ඩබ්.එම්. නන්දනී සෙනෙවිරත්න මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - නිකවැරටිය |
| වයි.එස්.එච්.පී.කේ.ජිතේන්ද්‍රසිංහ මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ |
| ජී.ඩී.එස්. චන්ද්‍රිකා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මීගමුව |
| ටී.ඩී. හෙට්ටිආරච්චි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ |
| එම්. මාලතී මුහුන්දනාදන් මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ |
| එස්. විශ්වනාදන් මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ |
| ඒ. මුරලිදරන් මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කොත්මලේ |
| එම්.බී.එස්. මාරසිංහ මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කෑගල්ල |
| ආර්.එම්. නාලනී කුසුමලතා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කෑගල්ල |
| පී.ජී. දමයන්ති මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - බලංගොඩ |
| ටී.එෆ්. සුහුඩ් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - හම්බන්තොට |
| එම්.ආර්.එම්. නවාස් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මඩකලපුව (මධ්‍යම) |
| කේ. ශාන්ත කුමාර් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කල්මුනේ |

# ලේඛක මණ්ඩලය

| | |
|---|---|
| පී. ශ්‍රීදේවි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - බදුල්ල |
| කේ. ශිවකුමාර් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - වලිකාමම් |
| ආර්. යශෝධරන් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - වඩමාරච්චි |
| එන්. තිරවසහන් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - තෙන්මරච්චි |
| එස්. සිවපාලන් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කිලිනොච්චි |
| ජී. චන්ද්‍රකුමාර් මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - වව්නියා උතුර |
| එම්.එස්.එස්. මුෆිඩා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල |
| පී.එල්. ඥානපාලි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කෑගල්ල |
| සී.පී.එච්.එල්.ආර්.එල්. චන්ද්‍රසේකර මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල |
| එන්.එන්. කල්‍යාණවතී මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ඉබ්බාගමුව |
| කේ.ඒ.පී. කුමාරි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කුලියාපිටිය |
| කේ.ඩබ්.එච්.ආර්.කරුණාරත්න මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - හලාවත |
| පී.ඩී. ලිලානි මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ශ්‍රී ජයවර්ධනපුර |
| කේ.ඩී. බුද්ධදාස මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම |
| එච්.එම්.සී.අයි. හේරත් බණ්ඩාර මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කටුගස්තොට |
| ඩබ්.එස්.ඩබ්.එම්. ස්වර්ණලතා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - දෙනුවර |
| ආර්.එම්.අයි. රත්නායක මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - නුවරඑළිය |
| එච්.එම්.කේ.ජී.සී. හේරත් මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - නාවුල |
| කේ.ඒ. ගාමිනී මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මාතලේ |
| එම්.එස්.එම්. අනීෆා මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කින්නියා |
| ඩී.එස්. ජයවර්ධන මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - අනුරාධපුරය |
| ඩී.එම්.කේ.බී. රත්නායක මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - ගලෙන්බිඳුණුවැව |
| ඩබ්.එම්.එම්. ජයසුන්දර මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - කැකිරාව |
| එච්.පී.ඩී.ඒ. කුලසූරිය මයා | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - හිඟුරක්ගොඩ |
| බී.ටී. චිත්‍රා සාදරී මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්බලන්ගොඩ |
| ඊ.එල්. ලලනි ලියනගේ මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - අකුරැස්ස |
| එන්.ජී. රම්‍යලතා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - හම්බන්තොට |
| සුනීතා කුමාරසිංහ මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - තංගල්ල |
| යූ.එස්. චන්ද්‍රලතා මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - වැලිමඩ |
| ආර්.එම්.අයි. රත්නායක මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - වියළුව |
| ඩබ්.පී.එම්. අබේසේකර මිය | - ගුරු උපදේශක (ප්‍රා.අ.) - කලාප අධ්‍යාපන කාර්යාලය - මොණරාගල |
| එච්.එම්. ෂර්ලි නෝමන් පීරිස් මයා | - ගුරු සේවය - පු/ විල්පොත බණ්ඩාරනායක ක.වි. - බත්තුළුඔය |
| එම්. අරුණ ප්‍රියංකර මයා | - ගුරු සේවය - පු/ කන්දතොඩුවාව ම.වි. - මදුරන්කුලිය |
| එච්.එම්.ඒ.සී. වීරසිංහ මිය | - ගුරු සේවය - බප/ජය/ තලංගම ලංකා සභා ක.වි. - බත්තරමුල්ල |
| පී.එම්. ප්‍රේමසීලී මිය | - ගුරු සේවය - වීරඹ ආදර්ශ විද්‍යාලය - ඇඹිලිපිටිය |
| ටී.එම්.එස්. සෙව්වන්දි මිය | - ගුරු සේවය - යාපහුව මේධංකර ප්‍රා.වි. - මහව |
| එච්.එම්.ඒ. රණසිංහ මයා | - ගුරු සේවය - හෙන්රි ඕල්කට් ප්‍රා.වි. - අඹන්පොල |
| ආර්.එම්.කේ. රාජපක්ෂ මිය | - ගුරු සේවය - අඹන්පොල ප්‍රා.වි. - අඹන්පොල |

### පරිගණකගත කිරීම

| | |
|---|---|
| කපිල රත්නායක මයා | - සංවර්ධන නිලධාරී - කලාප අධ්‍යාපන කාර්යාලය - මාතර |
| ඩී.ඒ.ඒ.පී. රණසිංහ මිය | - සංවර්ධන නිලධාරී - අධ්‍යාපන අමාත්‍යාංශය |

### විවිධ සහාය

| | |
|---|---|
| එස්.ඒ.ඩී. මොනිකා සමරසිංහ මෙය | - සංවර්ධන නිලධාරී - අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්.ඩී. බියංකා දමයන්ති මෙය | - සංවර්ධන නිලධාරී - අධ්‍යාපන අමාත්‍යාංශය |

ISBN 978-955-1214-48-7

cover design & printed by
www.designwavesmedia.com